# දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
# DEVI BALIKA VIDYALAYA – COLOMBO

මනසා සංවුතා ධීරා
Manasa Sanvutha Dheera

## 13 වන ශ්‍රේණිය තුන්වන වාර පරීක්ෂණය - 2021 දෙසැම්බර්
## Grade 13 Third Term Test 2021 December

රසායන විද්‍යාව I
Chemistry I

02 | S | I

පැය දෙකයි
Two hour

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු **10** කින් යුක්ත වේ.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ නම, විෂයය, පන්තිය සහ අංකය සඳහන් කරන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා (1) (2) (3) (4) (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන, එහි අංකය දී ඇති උපදෙස් අනුව උත්තර පත්‍රයේ ලකුණු කරන්න.

සර්වත්‍ර වායු නියතය $R = 8.314\ J\ K^{-1}\ mol^{-1}$
ඇවගාඩ්රෝ නියතය $N_A = 6.022 \times 10^{23}\ mol^{-1}$
ආලෝකයේ ප්‍රවේගය $C = 3.0 \times 10^{8}\ ms^{-1}$
ප්ලාන්ක් නියතය $h = 6.626 \times 10^{-34}\ Js$

---

1) . පරමාණුක ව්‍යුහය හා සම්බන්ධ පහත දැක්වෙන සොයා ගැනීම් සලකන්න.

I. හයිඩ්‍රජන් පරමාණුක වර්ණාවලිය විවරණය කිරීම.

II. පරමාණුවේ න්‍යෂ්ටික ආකෘතිය යෝජනා කිරීම.

ඉහත I හා II හි සඳහන් සොයා ගැනීම් කළ විද්‍යාඥයන් දෙදෙනා පිළිවෙළින්,

(1) ජේ. ජේ. තොම්සන් සහ රදර්ෆඩ්
(2) රදර්ෆඩ් සහ ජේ. ජේ. තොම්සන්
(3) නීල් බෝර් සහ රදර්ෆර්ඩ්
(4) මැක්ස් ප්ලාන්ක් සහ රදර්ෆර්ඩ්
(5) ඩී බ්‍රෝග්ලි සහ ජේ. ජේ. තොම්සන්

2) ක්‍රෝමියම් පරමාණුවේ ($Cr, Z = 24$) $l = 0$ සහ $m_l = 0$ ක්වොන්ටම් අංක ඇති ඉලෙක්ට්‍රොන සංඛ්‍යා පිළිවෙළින්,

(1) 8 සහ 11 වේ
(2) 8 සහ 10 වේ
(3) 7 සහ 12 වේ
(4) 7 සහ 11 වේ
(5) 7 සහ 13 වේ

3) $HP_2O_6^{3-}$ අයනය  සඳහා ඇඳිය හැකි ස්ථායී ලුවිස් තිත්-ඉරි ව්‍යුහ සංඛ්‍යාව වනුයේ,

(1) 3
(2) 4
(3) 5
(4) 6
(5) 7

4) දී ඇති සංයෝගයේ IUPAC නාමය වනුයේ



(1) 5–oxopent–1–en–3-one
(2) 3-oxopent-4-enal
(3) 1-formylpent-4-en-3-one
(4) 3-oxopent-4-eneal
(5) 5-formylpent-1-en-3-one

5) පහත දැක්වෙන සංයෝග වල ද්‍රවාංක අඩුවන පිළිවෙළ වනුයේ,

(1) $NaBr > KBr > MgBr_2 > MgI_2$
(2) $MgI_2 > MgBr_2 > KBr > NaBr$
(3) $KBr > NaBr > MgI_2 > MgBr_2$
(4) $KBr > NaBr > MgBr_2 > MgI_2$
(5) $MgBr_2 > MgI_2 > KBr > NaBr$



Scanned with CamScanner

6) MX හා MY නමැති ජලයේ මද වශයෙන් දියවෙන සංයෝග දෙකක ද්‍රාව්‍යතා ගුණිත (Ksp) පිළිවෙලින් $Ksp_1$ හා $Ksp_2$ වේ. ($Ksp_1 = 10^{-8}\ mol^2dm^{-6}$ $Ksp^2 = 10^{-9}\ mol^2dm^{-6}$). MX හා MY සංයෝග දෙකින්ම සංතෘප්ත ද්‍රාවණයක $M^+$ හි සාන්ද්‍රනය දෙනු ලබන්නේ,

(1) $\sqrt{Ksp_1} + \sqrt{Ksp_2}$  (2) $\sqrt{Ksp_1 + Ksp_2}$  (3) $\frac{Ksp_1}{[x^-]}$

(4) $\frac{Ksp_2}{[y^-]}$  (5) $\frac{Ksp_1}{[x^-]} + \frac{Ksp_2}{[y^-]}$

7) $H_2O_2$ ද්‍රාවණ 10 $cm^3$ කට ආම්ලික මාධ්‍යයකදී වැඩිපුර KI එක් කරන ලදී. පසුව එම ද්‍රාවණය 1 $moldm^{-3}$ $Na_2S_2O_3$ මගින් අනුමාපනය කරන ලදී. බියුරෙට්ටු පාඨාංකය 20.00 $cm^3$.
$H_2O_2$ ද්‍රාවණයේ ඝනත්වය 1.36 $gcm^3$ නම් එම ද්‍රාවණයේ $H_2O_2$ ස්කන්ධය අනුව ප්‍රතිශතය වන්නේ,
(H – 1, O – 16)

(1) 1.5%  (2) 2%  (3) 2,5%  (4) 3%  (5) 5%

8) $A + B + C \rightarrow D + E$. මෙම ප්‍රතික්‍රියාව විශ්ලේෂණයේදී පහත ප්‍රතිඵල ලැබුණි.

| ප්‍රතික්‍රියකවල ආරම්භක සාන්ද්‍රණ $mol\ dm^{-3}$ | | | D නිපදවීමේ ආරම්භක සීඝ්‍රතාවය / $mol\ dm^{-3}s^{-1}$ |
|---|---|---|---|
| [A] | [B] | [C] | |
| 0.010 | 0.010 | 0.010 | $2.0 \times 10^{-6}$ |
| 0.030 | 0.010 | 0.010 | $6.0 \times 10^{-6}$ |
| 0.030 | 0.020 | 0.010 | $1.2 \times 10^{-5}$ |
| 0.030 | 0.020 | 0.020 | $1.2 \times 10^{-5}$ |

(a) ප්‍රතික්‍රියාවේ වේග සමීකරණය වන්නේ $R = k[A][B]$
(b) C ට සාපේක්ෂව ප්‍රතික්‍රියාවේ පෙළ ශුන්‍ය වේ.
(c) වේග නියතය (k) හි ඒකකය $mol^2\ dm^{-6}$ වේ.
ඉහත ප්‍රකාශ වලින් සත්‍ය වන්නේ,

(1) a, b, c  (2) a, b  (3) b, c  (4) a පමණි  (5) b පමණි

9) සංයෝග හතරක ආම්ලිකතාව විචලනය වන ආකාරය පහත ප්‍රස්ථාරයේ දක්වා ඇත.




A, B, C, D සහ E පිළිවෙළින් වනුයේ,
(1) A – ඇසිටික් අම්ලය B - එතනෝල් C - පීනෝල් D - එතයින් E - එතීන්
(2) A - ඇසිටික් අම්ලය B - එතීන් C - එතනෝල් D - එතයින් E - පීනෝල්
(3) A – ඇසිටික් අම්ලය B - එතීන් C - එතනෝල් D - එතයින් E - පීනෝල්
(4) A - පීනෝල් B - එතීන් C - එතනෝල් D - එතයින් E – ඇසිටික් අම්ලය
(5) A – ඇසිටික් අම්ලය B - එතයින් C - එතනෝල් D - එතීන් E - පීනෝල්

Scanned with CamScanner

10) 27$^0$C දී $H_2(g) + \frac{1}{2}O_2(g) \longrightarrow H_2O(l)$ ; $\Delta H^\theta = -286$ kJ mol$^{-1}$

$N_2(g) + 3H_2(g) \longrightarrow 2NH_3(g)$ $\Delta G^\theta = -17$ kJ mol$^{-1}$

$\Delta S^\theta = -250$ J mol$^{-1}$ K$^{-1}$

නම් 27$^0$C දී $NH_{3(g)} + \frac{3}{4}O_{2(g)} \longrightarrow \frac{1}{2}N_{2(g)} + \frac{3}{2}H_2O_{(l)}$

යන ප්‍රතික්‍රියාවේ $\Delta H^\theta_{reaction}$ ගණනය කරන්න

(1) -327 kJ mol$^{-1}$ (2) -383 kJ mol$^{-1}$ (3) +327 kJ mol$^{-1}$

(4) +458 kJ mol$^{-1}$ (5) -458 kJ mol$^{-1}$

11) $H_2S_2O_3$ අම්ලයේ රසායනය සම්බන්ධයෙන් පහත ප්‍රකාශන සලකන්න.

a) දුබල ද්විභාෂ්මික අම්ලයකි.

b) ජලීය ද්‍රාවණ වලදී $H_2S_2O_3$ අම්ලය ද්විධාකරණයට ලක් වී S හා $SO_2$ සෑදිය හැක.

c) $S_2O_3^{2-}$ ඇනායනය ඔක්සිකාරකයක් ලෙස ක්‍රියා කරයි.

d) $AgNO_3$ සමග ප්‍රතික්‍රියාවෙන් සුදු පැහැති අවක්ෂේපයක් ලබාදෙයි.

මින් නිවැරදි වන්නේ,

(1) a, b හා c (2) a හා b (3) a හා c

(4) c හා d (5) b, c, d

12) Al ලෝහය MnO සමග සුදුසු තත්ව යටතේ පහත ආකාරයෙන් ප්‍රතික්‍රියා කොට Mn සාදයි.

$2Al + 3MnO \longrightarrow Al_2O_3 + 3Mn$

Al 108 g හා MnO 497g ක් අඩංගු මිශ්‍රණයක් අදාල තත්ව යටතේ ප්‍රතික්‍රියා කරවූ විට Mn 180 g ක් ලැබුණි. මෙහිදී සීමාකාරී ප්‍රතිකාරකය හා Mn වල ප්‍රතිශත ඵලදාව පිළිවෙලින්, (Mn – 55, Al – 27, O = 16)

$$\text{ප්‍රතිශත ඵලදාව} = \frac{\text{සත්‍ය ඵලදාව (g)}}{\text{සෛද්ධාන්තික ඵලදාව (g)}} \times 100\%$$

(1) MnO 45.5% (2) Al 54.5% (3) MnO 54.5% (4) Al 45.5% (5) Al 48%

13) 27°C දී $P(g) + 2Q(g) \rightleftharpoons R(g) + S(g)$ ප්‍රතික්‍රියාව සලකන්න.




සලකා බලන උෂ්ණත්වයේදී මෙම ප්‍රතික්‍රියාවේ $K_C$ අගය වන්නේ,

(1) 4 (2) 1.6 mol dm$^{-3}$ (3) 1.6 mol$^{-1}$ dm$^{-3}$

(4) 0.16 mol$^{-1}$dm$^{-3}$ (5) 0.625 mol$^{-1}$dm$^3$

Scanned with CamScanner

14) ෆ්‍රිඩල් - ක්‍රාෆ්ට් ඇල්කයිල්කරණ යාන්ත්‍රණයේ අවස්ථාවක් නොවන්නේ

1) $CH_3 - Cl \ + AlCl_3 \rightleftharpoons CH_3 - Cl^+ \, Al^- Cl_3$

2) 

3)  $+ \ AlCl_4^-$

4)  $+ \ AlCl_4^-$

5) 

15) 


$E^\theta_{Fe^{2+}/Fe^{3+}} = +0.77 \ V$

$30^0C$ දී මෙම කෝෂය ක්‍රියාත්මක වන විට ලවණ සේතුවේ සිට $K^+$ අයන $Fe^{2+} / Fe^{3+}$ ද්‍රාවණයට එකතු වේ.

A) $E^\theta_{X_2/X^{n-}}$ හි අගය +0.54V විය හැක.

B) $E^\theta_{X_2/X^{n-}}$ හි අගය +1.36 V විය හැක.

C) මෙම කෝෂය ක්‍රියාත්මක වන විට පද්ධතියේ අහඹුතාව වැඩිවේ.

මෙම කෝෂය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,

(1) A පමණි (2) B පමණි (3) C පමණි
(4) A, C පමණි (5) B, C පමණි

16) $2NH_3(g) + \frac{5}{2} \ O_2(g) \rightleftharpoons 2NO(g) + 3H_2O(g)$ යන ප්‍රතික්‍රියාවේ සමතුලිතතා නියතය සඳහා ප්‍රකාශනය වන්නේ,

$N_2(g) + 3H_2(g) \rightleftharpoons 2NH_3(g) \quad k_1$

$N_2(g) + O_2(g) \rightleftharpoons 2NO(g) \quad k_2$

$H_2(g) + \frac{1}{2} O_2(g) \rightleftharpoons H_2O(g) \quad k_3$

(1) $k_1k_2k_3$ (2) $\frac{k_1k_2}{k_3}$ (3) $\frac{k_2k_3^2}{k_2}$ (4) $\frac{k_2k_3^3}{k_1}$ (5) $\frac{k_1k_3^3}{k_2}$

Scanned with CamScanner

17) 25 °C හිදී සංශුද්ධ $CH_3COOH$ 1 x $10^{-4}$ mol හා NaOH 1 x $10^{-4}$ mol ජලයේ දියකර 100 $cm^3$ ද්‍රාවණයක් සාදනු ලැබේ. එම ද්‍රාවණයේ pH අගය වන්නේ
($CH_3COOH$ හි Ka = 1 x $10^{-5}$ mol $dm^{-3}$)

(1) 2 (2) 3 (3) 6 (4) 8 (5) 9

18) V ප්‍රවේගයෙන් ගමන් කරන X නම් සමද්වි පරමාණුක වායු අණුවේ තරංග ආයාමය λ වේ. එය උපස්ථරයක ගැටීමෙන් වායුමය පරමාණු බවට පත්වේ. එවිට එක් පරමාණුවක චාලක ශක්තිය ආරම්භක අගය මෙන් දෙගුණයකි. මෙම වායුමය පරමාණුවේ ඩී. බ්‍රෝග්ලි තරංග ආයාමය වන්නේ,

(1) $\frac{\lambda}{4}$ (2) $\frac{\lambda}{2}$ (3) λ (4) 2λ (5) 4λ

19) A, B, C, D යනු s ගොනුවට අදාළ සංයෝග හතරකි. එම සංයෝග පිළිබඳව පහත වගන්තිවලින් පැහැදිලි කරයි.

A – තාප වියෝජනය කලවිට ඔක්සයිඩය, නයිට්‍රජන් ඩයොක්සයිඩ් ඔක්සිජන් ලබාදෙයි.

B – සාපේක්ෂව අඩු තාප වියෝජන උෂ්ණත්වයක් ඇත.

C – අල්ප වශයෙන් ජල ද්‍රව්‍ය සංයෝගයකි.

D - ජලයේ අද්‍රාව්‍ය ලවණයකි.

ඉහත ප්‍රකාශ ඇසුරින් A, B, C, D නිවැරදිව පිළිවෙලින් සඳහන් වන පිළිතුර වන්නේ,

(1) $LiNO_3$ , $MgCO_3$ , $CaSO_4$ , $Li_3PO_4$

(2) $LiPO_4$ , $MgCO_3$, $LiNO_3$ , $CaSO_4$

(3) $LiNO_3$ , $MgCO_3$ , $LiPO_4$ , $CaSO_4$

(4) $MgCO_3$ , $LiNO_3$ , $CaSO_4$ , $LiPO_4$

(5) $CaSO_4$ , $MgCO_3$ , $LiNO_3$ , $LiPO_4$

20) $C_2H_4(g) + H_2(g) \rightarrow C_2H_6(g)$ මෙම ප්‍රතික්‍රියාව ඉහළ උෂ්ණත්වයේදී සිදුනොවන නමුත් 298 K දී ස්වයංසිද්ධ වේ. 298 K දී මෙම ප්‍රතික්‍රියාව සම්බන්ධයෙන් පහත කුමක් සත්‍යවේ ද?

| | ΔG | ΔH | ΔS |
|---|---|---|---|
| 1) | ධන | ධන | ධන |
| 2) | ඍන | ඍන | ධන |
| 3) | ධන | ධන | ඍන |
| 4) | ඍන | ඍන | ධන |
| 5) | ඍන | ඍන | ඍන |

21) ද්‍රව බ්‍රෝමීන් 40g ක් ජලය 500 $cm^3$ හා කාබනික ද්‍රාවක 500 $cm^3$ ක මිශ්‍ර කරනු ලැබේ. සමතුලිතතාවය ඇතිවූ පසු කාබනික ස්ථරය වෙන්කර ගෙන වැඩිපුර ෆීනෝල් එක් කළ විට ලැබුණු අවක්ෂේපය වියළා ගත් විට ස්කන්ධය 49.65g විය. ජලය හා කාබනික ස්ථරය බ්‍රෝමීන්හි $K_D$ අගය වන්නේ,
(Br = 80, C = 12, H = 1, O = 16)

(1) $\frac{1}{3}$ (2) $\frac{2}{3}$ (3) $\frac{2}{5}$ (4) $\frac{1}{5}$ (5) $\frac{1}{9}$

22) C සහ එහි ඔක්සයිඩ සම්බන්ධව පහත කුමන වගන්තිය අසත්‍ය වේ ද?

(1) CO හි බන්ධන දිග $CO_2$ හි ද්විත්ව බන්ධනයට වඩා කෙටි වේ.

(2) CO හා $CO_2$ ඔක්සිහාරක ලෙස ක්‍රියා කරයි.

(3) d ගොනුවෙ කැටායන සාදන සංකීර්ණවල බන්ධ කාණ්ඩ ලෙස CO ක්‍රියා කරයි.

(4) CO හා $CO_2$ නිර්ධ්‍රැවීය අණුවේ.

(5) $CO_2$ අණුව සඳහා සම්ප්‍රයුක්ත ව්‍යුහ තුනක් ඇත.

Scanned with CamScanner

23) සන්නායකතාවය පිළිබඳ සත්‍ය වගන්තිය/වගන්ති වන්නේ,

a) සෑම විටම ප්‍රබල විද්‍යුත් විච්ඡේද්‍යයක සාන්ද්‍රණයට අනුලෝම විද්‍යුත් සන්නායකතාව වැඩිවේ.

b) ද්‍රව සන්ධි විභවයක් ඇති වීමට හේතු වන්නේ විද්‍යුත් විච්ඡේද්‍යයන්හි සන්නායකතා අසමාන අයන පැවතීමය.

c) ප්‍රබල විද්‍යුත් විච්ඡේද්‍යයක උෂ්ණත්වය වැඩිවත්ම අයනවල සචලතා වැඩිවන බැවින් සන්නායකතාව වැඩිවේ.

d) දුබල අම්ල දුබල භෂ්ම අනුමාපනයක සමකතා ලක්ෂ්‍යය නිර්ණය කිරීම සඳහා එහි සන්නායකතා මිනුම භාවිතා කළ හැක.

(1) a, b, c (2) b, c, d (3) c, d (4) a, c, d (5) a, b, c, d

24) $2 \times 10^{-3}$ mol dm$^{-3}$ $M^+(aq)$ ද්‍රාවණ 500 cm$^3$ ක් හා $2 \times 10^{-3}$ mol dm$^{-3}$ HA(aq) දුබල අම්ලයේ 500 cm$^3$ මිශ්‍ර කරන ලදී. MA(s) අවක්ෂේප වීම ආරම්භ වන තුරු ඉහත ද්‍රාවණයට ඝන NaA එක් කරන ලදී. එවිට ද්‍රාවණයේ pH අගය 4 නම් HA හි pKa හි අගය වන්නේ, (Ksp(MA) = $1 \times 10^{-7}$ mol$^2$dm$^{-6}$

(1) 3 (2) 4 (3) 4.5 (4) 5 (5) 5.5

25) අසත්‍ය ප්‍රකාශය වන්නේ,

(1) හුමාල ආසවනය උෂ්ණත්වයට සංවේදී ශාකමය ද්‍රව්‍ය නිස්සාරණය සඳහා භාවිතා කරයි.

(2) තාපාංකය එකිනෙකට වෙනස් පරිපූර්ණ සංඝටක වලින් සෑදුනු ද්‍රාවණයකින් සංඝටක වෙන් කිරීමට භාගික ආසවනය භාවිතා කරයි

(3) ට්‍රාන්ස් එස්ටරීකරණ ප්‍රතික්‍රියාවක් මගින් ජෛව ඩීසල් නිපදවයි.

(4) මීරා හා විනාකිරි වෙන් කිරීම සඳහා හුමාල ආසවනය භාවිතා කරයි.

(5) එතනෝල් ඔක්සිකරණයෙන් ලැබෙන ඇසිටික් අම්ලය තනුක කිරීමෙන් කෘතිම විනාකිරි ලබා ගනී.

26) T උෂ්ණත්වයේදී සංවෘත බඳුනක් තුළට A(g) හා D(g) මිශ්‍රණයක් ඇතුල් කරන ලදී. ආරම්භක පීඩනය P වේ. පහත ලෙස ඒවා ප්‍රතික්‍රියා කරන අතර ප්‍රතික්‍රියා දෙකම මූලික ප්‍රතික්‍රියා වේ. A හා D සම්පූර්ණයෙන්ම වියෝජනය වූ විට මුළු පීඩනය 2.5 P විය.

$$A(g) \longrightarrow 2B(g) + 2C(g)$$

$$2D(g) \longrightarrow E(g) + 3F(g)$$

A(g) වියෝජනයේ ආරම්භක ශීඝ්‍රතාවය R නම්,

(1) $R = K\left(\frac{P}{RT}\right)$ (2) $R = 2.5\ K\ K\left(\frac{P}{RT}\right)$ (3) $R = 0.25\ K\left(\frac{P}{RT}\right)$

(4) $R = 1.5\ K\left(\frac{P}{RT}\right)$ (5) $R = 2K\left(\frac{P}{RT}\right)$

27) පහත සඳහන් කුමන ප්‍රකාශය අසත්‍ය වේද?

(1) 10 $^0$C වැඩි උෂ්ණත්ව යටතේ $HNO_2$ සමග ඇනිලීන් දක්වන ප්‍රතික්‍රියාවේ දී $N_2$ වායුව පිට වේ

(2) නයිට්‍රෝබෙන්සීන් නිර්ජලීය $AlCl_3$ හා $CH_3Cl$ සමඟ ප්‍රතික්‍රියාවෙන් metanitrotoluene ලබාගත හැකිය.

(3) ග්‍රිනාඩ් ප්‍රතිකාරකයට නියුක්ලියෝෆයිලයක් මෙන්ම භෂ්මයක් ලෙසට ක්‍රියා කළ හැක.

(4) 1 – butanal වලට වඩා 2 – butanal වල ජලයේ ද්‍රාව්‍යතාව වැඩිවේ.

(5) එතනැල් වල තාපාංකය ට වඩා ප්‍රොපනෝල් වල තාපාංකය වැඩිය.

28) සාන්ද්‍රණය 0.15 mol dm$^{-3}$ ක් වන HCl ද්‍රාවණයක 25.00 cm$^3$ ක් සමඟ සාන්ද්‍රණය 0.05 mol dm$^{-3}$ ක් වන ඒකආම්ලික දුබල භෂ්මයක් වන B අනුමාපනය කරනු ලැබේ. (25 $^0$C දී $K_b = 1.00 \times 10^{-6}$ mol dm$^{-3}$) සමකතා ලක්ෂය ලැබීමෙන් පසු තවත් භෂ්මය B 15 cm$^3$ එක් කළවිට pH අගය වන්නේ,

(1) 8 + lg 5 (2) 8 – lg 5 (3) 6 + lg 5

(4) 6 – lg 5 (5) lg 5 – 6

Scanned with CamScanner

29) $^{+}NH_3CH_2COOH$ හා NaOH අතර අනුමාපනය සඳහා pH වක්‍රය පහත දැක්වේ.




පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,

1) පළමු සමකතා ලක්ෂ්‍යය භෂ්මය 25 $cm^3$ ක් එක් කළවිට ලැබෙන අතර එවිට pH අගය 5.97 වේ.

2) පළමු සමකතා ලක්ෂ්‍යය භෂ්මය 12.5 $cm^3$ ක් එක් කළවිට ලැබෙන අතර එවිට pH අගය 2.34 වේ.

3) මෙහිදී සමකතා ලක්ෂ 03 ක් ලැබේ.

4) ආරම්භක ද්‍රාවණයේ $^{+}NH_3OHCOOH(aq) + H_2O(l) \rightleftharpoons NH_2CH_2COOH(aq) + H_3O^+(aq)$ සමතුලිතය ඇති වේ.

5) තෙවන සමකතා ලක්ෂයේ දී භෂ්මයෙන් 50 $cm^3$ එක් කළවිට ලැබේ.

30)




ඉහත සඳහන් ප්‍රතික්‍රියාවේ ප්‍රධාන ඵලය A වනුයේ,

1)




2)




3)




4)




5)




Scanned with CamScanner

**31 සිට 40 දක්වා ප්‍රශ්න සඳහා උපදෙස්**

එක් එක් ප්‍රශ්නයේ දක්වා ඇති (a), (b), (c) සහ (d) යන ප්‍රතිචාර 4 අතුරෙන් එකක් හෝ වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය / ප්‍රතිචාර කවරේ දැයි තෝරා ගන්න.

(a) සහ (b) පමණක් නිවැරදි නම් (1) මත ද

(b) සහ (c) පමණක් නිවැරදි නම් (2) මත ද

(c) සහ (d) පමණක් නිවැරදි නම් (3) මත ද

(d) සහ (a) පමණක් නිවැරදි නම් (4) මත ද

වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් (5) මත ද උත්තර පත්‍රයෙහි දැක්වෙන උපදෙස් පරිදි ලකුණු කරන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) |
| (a) සහ (b) පමණක් නිවැරදියි | (b) සහ (c) පමණක් නිවැරදියි | (c) සහ (d) පමණක් නිවැරදියි | (d) සහ (a) පමණක් නිවැරදියි | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදිය |

31) 3d මූල ද්‍රව්‍ය සම්බන්ධයෙන් සත්‍ය වගන්තිය / වගන්ති වන්නේ,

a) විචල්‍ය ඔක්සිකරණ අංක පෙන්වන d ගොනුවේ මූල ද්‍රව්‍ය වල ඉහලම ඔක්සිකරණ අංකයට උපරිම විද්‍යුත් ඍණතාවක් ඇත.

b) උත්ප්‍රේරක ලෙස ක්‍රියා කරන d ගොනුවේ මූලද්‍රව්‍ය වලට අර්ධ වශයෙන් ඉලෙක්ට්‍රෝන පිරුණු හෝ හිස් d කාක්ෂික හෝ පවතී.

c) ආන්තරික මූලද්‍රව්‍යවල කැටායන අඩංගු ජලීය ද්‍රාවණ වර්ණවත් වේ.

d) $MnO_4^-$ වල ජලීය ද්‍රාවණයක් සාන්ද්‍ර HCl සමග ප්‍රතික්‍රියාවේ දී $MnO_4^-$ වල ඔක්සිහරණයක් සිදුවේ.

32) පහත ප්‍රකාශ අතරින් අසත්‍ය වන්නේ

a) ඕනෑම මූලද්‍රව්‍යයක දෙවන ඉලෙක්ට්‍රෝනකරණයේදී පරිසරයෙන් තාපය උරාගනී.

b) CO ධ්‍රැවීය අණුවක් වුවද ගෝලීය උණුසුම කෙරෙහි බලපෑමක් නොකරයි.

c) සියලු මූලද්‍රව්‍යවල සඵල න්‍යෂ්ටික ආරෝපණය , න්‍යෂ්ටික ආරෝපණයට වඩා වැඩි වේ.

d) α හා β කිරණ විද්‍යුත් ක්ෂේත්‍රයකදී සාමාන ප්‍රමාණ යෙන් ප්‍රතිවිරුද්ධ දිශාවට උත්ක්‍රමණය වේ

33) රසායනික ප්‍රතික්‍රියාවක චාලකය සම්බන්ධයෙන් අසත්‍ය වනුයේ,

(a) සීඝ්‍රතා නියතයේ ඒකක එහි පෙළ අනුව වෙනස් වේ.

(b) උත්ප්‍රේරක මගින් පෙළ වෙනස්විය හැකිය.

(c) බහුපියවර ප්‍රතික්‍රියාවක සමස්ත සීඝ්‍රතාව කෙරෙහි බලපාන්නේ සෙමින් සිදුවන පියවර වේ.

(d) බහුපියවර ප්‍රතික්‍රියාවක සමස්ත පෙල සැමවිටම සෙමින් සිදුවන පියවරෙහි අනුකතාවයට සමාන වේ.

34) පහත දී ඇති අනුව සම්බන්ෂයෙන් කුමන වගන්තිය/ වගන්ති සත්‍ය වේද?



a) එය $Br_2$ දියර විවර්ණ කරයි.

b) ජලීය HBr සමඟ ප්‍රතික්‍රියාවෙන් ලැබෙන ඵලය ප්‍රකාශ සක්‍රීය වේ.

c) සංයෝගයේ සියලුම පරමාණු එකම තලයේ පවතී.

d) තනුක NaOH සමඟ සංඝනන ප්‍රතික්‍රියා සිදු කරයි.

Scanned with CamScanner

35) පහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,

(a) ඇසියෝට්‍රොපීය (azeotrophic) මිශ්‍රණයක් රවුල් නියමය පිළිපදින අතර භාගික ආසවනයෙන් සංශුද්ධ සංඝටක වෙන් කළ නොහැකිය.

(b) ඇසියෝට්‍රොපීය (azeotrophic) මිශ්‍රණයක දී නියත තාපාංක ගුණයක් ලැෙ

(c) වාෂ්පශීලීතාවයෙන් අඩු ද්‍රාව්‍යයක් වාෂ්පශීලී ද්‍රාවකයක දිය කළවිට තාපාංක ආරෝහණයක් සිදුවන අතර එය ද්‍රාව්‍යයේ මවුල ප්‍රමාණයට අනුලෝමව සමානුපාතික වේ.

(d) වාෂ්ප පීඩන පාතනය හා තාපාංක ආරෝහණය මිශ්‍රණයක ඇති ද්‍රාව්‍යයේ ප්‍රමාණය මත පමණක් රඳාපවතින අතර එය ද්‍රාව්‍යයේ පවතින ස්වභාවය මත රඳා නොපවතී.

36) පහත ප්‍රකාශන වලින් සත්‍ය වන්නේ,

(a) ඕසෝන් වියන හායනයට හේතු වන CFC තාප වියෝජනයට ලක් නොවන ස්ථායි සංයෝග වන අතර වාෂ්පශීලීතාව ඉහල වෙයි

(b) ප්‍රකාශ රසායනික ධූමිකාව ට හේතු වන NO වායුව, වාහන එන්ජිම තුල ඉන්ධන දහනයේ දී ඇතිවන අධික උෂ්ණත්වය හා පීඩන තත්ත්වය නිසා අක්‍රීය $N_2$ හා $O_2$ ප්‍රතික්‍රියාවෙන් සෑදෙයි.

(c) ජලය අයනීකරණයෙන් $H^+$ හා $OH^-$ සාදන බැවින් පිරිසිදු ජලයේ සන්නායකතාව ඉහළවේ.

(d) බහු සංයුජ ලෝහ කැටායන ජලයේ පවතින විට සබන්වල කාබොක්සිලේට් කාණ්ඩය එම කැටායන සමග සම්බන්ධ වී. එම සබන්වල ශෝධන ක්‍රියාව පහසුවේ.

37) සල්ෆර් හා සල්ෆර් අඩංගු සංයෝග පිළිබඳ නිවැරදි වගන්තිය / වගන්ති වන්නේ,

a) සල්ෆර්වල ක්ලෝරයිඩයක් වන $SCl_2$ ජල විච්ඡේදනයේදී $H_2SO_3$ හා S ලබාදේ.

b) සල්ෆර් තනුක NaOH සමග ප්‍රතික්‍රියාවෙන් $Na_2S$, $Na_2S_2O_3$ හා ජලය පමණක් ලබාදේ.

c) සල්ෆර්වල හයිඩ්‍රයිඩය ලෝහ සමග අම්ලයක් ලෙස මෙන්ම ඔක්සිකාරකයක් ලෙස ද ක්‍රියා කරයි.

d) රොම්බසීය හා ඒකානති සල්ෆර්, සල්ෆර්වල දක්නට ලැබෙන ස්ඵටිකරූප බහුරූපී ආකාර වන අතර 95 $^0C$ ට ඉහළ උෂ්ණත්වවලදී රොම්බසීය සල්ෆර් ස්ථායි වේ.

38) Pt(s) | Hg(l) | $Hg_2Cl_2$(s) | $Cl^-$ (aq) | AgCl(s) | Ag(s) යනු ගැල්වානි කෝෂයක අංකනයයි. මෙම කෝෂය සම්බන්ධයෙන් සත්‍ය වන්නේ,

(a) මෙහි කැතෝඩය හා ඇනෝඩය ලවණ සේතුවකින් සම්බන්ධ කර ඇති බැවින් ද්‍රව සන්ධි විභවයක් ඇති නොවේ.

(b) විද්‍යුත් විච්ඡේද්‍යයේ $Cl^-$ අයන සාන්ද්‍රනය වෙනස් කිරීමෙන් කෝෂයේ විද්‍යුත් ගාමක බලය වෙනස් නොවේ.

(c) කෝෂය ක්‍රියාත්මක කළවිට කැතෝඩයේ ස්කන්ධය අඩුවේ.

(d) කෝෂය ක්‍රියාත්මක කළවිට Pt කම්බියේ සිට Ag කම්බිය වෙත විද්‍යුත් ධාරාවක් බාහිර පරිපථය ඔස්සේ ගමන් කරයි.

39) පහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,

(a) පරිපූර්ණ වායු අණුවල මධ්‍යන්‍ය චාලක ශක්තිය නිරපේක්ෂ උෂ්ණත්වය හා වායු වර්ගය මත පමණක් රඳා පවතී.

(b) පරිපූර්ණ වායු අණුවලට ගුරුත්වාකර්ෂණ බලය ක්‍රියාත්මක විය හැක.

(c) නියත උෂ්ණත්වයේදී වායු අණු වල මධ්‍යන්‍ය වේගය, වර්ග මධ්‍යන්‍ය මූල වේගයට වඩා අඩුවෙයි.

(d) මෙම ප්‍රස්ථාරයට අනුව $M_A > M_B$. (A හි මවුලික ස්කන්ධය $M_A$ හා B හි මවුලික ස්කන්ධය $M_B$ වේ.)

(නියත උෂ්ණත්වයේදී)




Scanned with CamScanner

40) පහත ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ,

(a) ඩව් කෝෂයේ දී $Mg(OH)_2$ උපරිම ලෙස අවක්ෂේපකර ගැනීම සඳහා CaO වැඩිපුර එකතු කරයි.

(b) පටල කෝෂය හා ප්‍රාචීර කෝෂයේ ප්‍රධාන වෙනස වන්නේ, $Na^+$ අයන සඳහා පාරගම්‍ය පටලයක් පටල කෝෂයේ භාවිතා කිරීමයි.

(c) සබන් නිෂ්පාදනයේ ශීත ක්‍රියාවලියේ දී සබන් හා ග්ලිසරෝල් වෙන් කිරීමක් සිදු නොකරයි.

(d) ඇමෝනියා නිෂ්පාදනයේදී උත්ප්‍රේරක යෙදීමෙන් ඵලදාව වැඩි කරයි.

✱ **අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට උපදෙස්**

අංක 41 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා ප්‍රකාශ දෙක බැගින් ඉදිරිපත් කර ඇත. එම ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැලපෙනුයේ පහත වගුවේ දක්වෙන පරිදි (1) (2) (3) (4) හා (5) යන ප්‍රතිචාරවලින් කවර ප්‍රතිචාරය දැයි තෝරා උත්තර පත්‍රයෙහි උචිත ලෙස ලකුණු කරන්න.

| ප්‍රතිචාරය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍යය | සත්‍ය වන අතර පළමුවැන්න නිවැරදිව පහදා දෙයි |
| (2) | සත්‍යය | සත්‍ය වන නමුත් පළමුවැන්න නිවැරදිව පහදා නොදෙයි |
| (3) | සත්‍යය | අසත්‍යයයි |
| (4) | අසත්‍යයයි | සත්‍යය |
| (5) | අසත්‍යයයි | අසත්‍යයයි |

| | පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 41) | O හා $O^{2-}$ වල න්‍යෂ්ටික ආරෝපණ වෙනස් වේ. | එකම මූලද්‍රව්‍යයේ සමස්ථානිකවල න්‍යෂ්ටික ආරෝපණ වෙනස් වේ. |
| 42) | 0.1mol $dm^{-3}$ $CH_3COONa$ හා 0.1 mol $dm^{-3}$ $CH_3COOH$ අඩංගු ද්‍රාවණයක් සීමිත තනුකකරණයේදී pH වෙනස් නොවුණ ද, 0.1 mol $dm^{-3}$ $CH_3COONH_4$ හි දී pH අගය වෙනස් වේ. | $CH_3COONa$ හා $CH_3COOH$ අඩංගු සමමවුලික ද්‍රාවණයක ස්වාරක්ෂක ධාරිතාවය සැමවිටම ඉහළවේ. |
| 43) | සල්ෆියුරික් නිෂ්පාදනයේ දී සමස්ථ $SO_2$ ප්‍රමාණය පියවර හතරක් ඔස්සේ $SO_3$ බවට පරිවර්තනය කරයි. | $SO_2$ හා $O_2$ ප්‍රතික්‍රියාවේ දී තාපය ජනනය කරන නිසා සමස්ත ප්‍රතික්‍රියාව එකවර සිදු කළ විට පසුපස ප්‍රතික්‍රියාව දිරිමත් වී ඵලදාව අඩුවේ. |
| 44) | නියත උෂ්ණත්වයේදී දෙන ලද පරිපූර්ණ වායුවක මධ්‍යන්‍ය චාලක ශක්තිය නියතයකි | නියත උෂ්ණත්වයේදී දෙන ලද පරිපූර්ණ වායුවක සැම අණුවකම වේගය නියත වේ |
| 45) | උත්ප්‍රේරක හමුවේ $C_2H_5OH$ හා $CH_3COOH$ අතර එස්ටරීකරණ ප්‍රතික්‍රියාවේ පළමු පියවර නියුක්ලියෝෆිලික ආකලන ප්‍රතික්‍රියාවකි | එස්ටරීකරණ ප්‍රතික්‍රියාවේ ඇල්කොහොලය නියුක්ලියෝෆයිලයක් ලෙසට ක්‍රියා කරයි. |
| 46) | $Cu^{2+}$ හා $Zn^{2+}$ අඩංගු ද්‍රාවණයකට භාෂ්මික මාධ්‍යයකදී $H_2S$ බුබුලනය කල විට ZnS පමණක් අවක්ෂේප වේ | දෙන ලද උෂ්ණත්වයක්දී ZnS හි Ksp , CuS වලට වඩා ඉහළවේ |
| 47) | ජල සාම්පලයක ද්‍රවිත කාබනික සංයෝග හේතුවෙන් එම නියැදියේ COD (රසායනික ඔක්සිජන් ඉල්ලුම) වෙනස් වුවද DO (ද්‍රවිත ඔක්සිජන්) වලට හා BOD (ජෛව ඔක්සිජන් ඉල්ලුම) වලට බලපෑමක් නොකරයි. | COD මගින් ගණනය කරනු ලබන්නේ රසායනිකව ඔක්සිකරණය කළ හැකි ප්‍රභේද සඳහා වැය වන ඔක්සිජන් ඉල්ලුම වේ. |
| 48) | $CH_3CH = CHCH_3$ ත්‍රිමාන සමාවයවිකතාව පෙන්වයි. | $CH_3CH=CHCH_3$ පාරත්‍රිමාන සමාවයවිකතාව නොපෙන්වයි. |
| 49) | ශුන්‍ය පෙළ ප්‍රතික්‍රියාවක අර්ධ ජීව කාලය ආරම්භක සාන්ද්‍රණයෙන් ස්වායත්ත වේ. | ප්‍රතික්‍රියාවක පෙළ ප්‍රතික්‍රියකවල ආරම්භක සාන්ද්‍රණය මත රඳා නොපවතී. |
| 50) | කාර්මික අපජලය හා නිවෙස්වල පිරිසිදුකාරක මගින් ජලාශවලට $PO_4^{3-}$ අයන එකතු වේ. එවිට වේගයෙන් ඇල්ගී වර්ධනය වීම සුපෝෂණයයි. | ඇල්ගී වර්ධනයේ සීමාකාරී සාධකය $PO_4^{3-}$ අයන වේ. |



Scanned with CamScanner

## B කොටස - රචනා

ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නයට ලකුණු 15 බැගින් ලැබේ.)

5) a) 300 K හිදී $Y_2(g)$ අඩංගු 24.942 $dm^3$ වන දෘඪ සංවෘත භාජනයක් තුළ XY (g) හා $Z_2(g)$ පිළිවෙලින් 3 mol හා 4 mol බැගින් එකතු කරයි. බඳුන තුළට XY(g) හා $Z_2(g)$ එකතු කළ විට ආරම්භක පීඩනය $12 \times 10^5\ Nm^{-2}$ වේ. ඉන්පසු පද්ධතිය තුළ පහත ප්‍රතික්‍රියා සිදුවේ.

$$3XY(g) + 2Z_2(g) \longrightarrow 3XZ(g) + ZY_3(l) \longrightarrow (1)$$
$$XZ(g) + Y_2(g) \rightleftharpoons XY(g) + ZY(g) \longrightarrow (2)$$

(ප්‍රතික්‍රියා සිදුවීමේදී කිසිදු උෂ්ණත්ව විපර්යාසයක් සිදුනොවන බවද මෙහි පළමු ප්‍රතික්‍රියාවේ සීඝ්‍රතාවය දෙවන ප්‍රතික්‍රියාවට සාපේක්ෂව ඉතා ඉහළ බවද උපකල්පනය කරන්න.)

සමතුලිතතාවයට එළඹුනු විට ZY(g) හි ආංශික පීඩනය $6.0 \times 10^5\ Nm^{-2}$ වන බවද සොයාගන්නා ලදී.

i) ආරම්භක $Y_2(g)$ මවුල ගණන සොයන්න.

ii) ඉහත සමතුලිත පද්ධතියේ XY හි මවුල ප්‍රමාණය ZY හි මවුල ප්‍රමාණයට වඩා අඩු වන්නේ මන්දැයි සරලව පහදන්න.

iii) ද්‍රව $ZY_3$ පරිමාව ගණනය කරන්න.

iv) සමතුලිත $Y_2(g)$ මවුල ගණන සොයන්න.

v) සමතුලිත ප්‍රතික්‍රියාවට අදාල $K_P$ ගණනය කරන්න.

(මවුලික ස්කන්ධ Z – 53.14 $gmol^{-1}$ Y – 10 $g\ mol^{-1}$)

$ZY_3$ හි ඝනත්වය 20 $g\ dm^{-3}$ )

(ලකුණු 7.0)

b) ආම්ලික මාධ්‍යයේදී $H_2O_2$ හා $I^-$ අයන අතර ප්‍රතික්‍රියාවේ සීඝ්‍රතාවය සෙවීම සඳහා කරන ලද පරීක්ෂණයක තොරතුරු පහත දක්වේ.

සිසුන් කණ්ඩායමක් විසින් 0.1 mol $dm^{-3}$ $Na_2S_2O_3$ ද්‍රාවණයකින් 10.0 $cm^3$ ක් 0.06 mol $dm^{-3}$ $I^-$ ද්‍රාවණ පරිමා 50.0 $cm^3$ කට 0.03 mol $dm^{-3}$ $H_2O_2$ ද්‍රාවණ 40.0 $cm^3$ ක් සමග මිශ්‍රකර 25°C දී ද්‍රාවණය නිල් පැහැ වීමට ගතවන කාලය මනින ලදී. ද්‍රාවණයේ නිල් පැහැවීමට තත්පර 50 ක් ගතවිය.

i) $H_2O_2$ හා $I^-$ අතර ප්‍රතික්‍රියාවේ තුලිත අයනික සමීකරණය ලියන්න.

ii) $Na_2S_2O_3$ සහ $I_2$ අතර ප්‍රතික්‍රියාවේ තුලිත සමීකරණය ලියන්න.

iii) ඉහත කාලය තුළදී සෑදෙන $I_2$ මවුල ගණන සොයන්න.

iv) $I^-$ වැයවීමේ සීඝ්‍රතාවය සොයන්න.



Scanned with CamScanner

v) $H_2O_2$ වැයවීමේ සීඝ්‍රතාවය සොයන්න.

vi) $H_2O_2$ වලට සාපේක්ෂව ප්‍රතික්‍රියාවේ සීඝ්‍රතාවය සොයන්න.

vii) $H_2O_2$ වල සාන්ද්‍රණයට සාපේක්ෂව පෙල සෙවීම සඳහා සිසුන් කණ්ඩායමක් විසින් කරන ලද පරීක්ෂණයකදී මිශ්‍රකරන ලද ද්‍රාවක පරිමා සහ නිල් වර්ණය ලැබීමට ගතවන කාලය මනින ලදී.

| පරීක්ෂණ අංකය | $H^+/H_2O_2$ ද්‍රාවණ පරිමාව / $cm^3$ | KI ද්‍රාවණ පරිමාව / $cm^3$ | පිෂ්ඨය සහිත $Na_2S_2O_3$ පරිමාව / $cm^3$ | $H_2O$ පරිමාව / $cm^3$ | නිල් වර්ණය ලැබීමට ගතවූ කාලය / s |
|---|---|---|---|---|---|
| 1 | 25.0 | 10.0 | 15.0 | - | 20 |
| 2 | 20.0 | 10.0 | 15.0 | 5.0 | 25 |
| 3 | 15.0 | 10.0 | 15.0 | 10.0 | 33 |

I) ඉහත පරීක්ෂණයේදී $Na_2S_2O_3$ හි කාර්ය කුමක් ද?

II) ඉහත දත්ත ඇසුරින් $H_2O_2$ වලට සාපේක්ෂ පෙල සොයන්න.

III) පහත වෙනස්කම් යටතේ පරීක්ෂණය සිදුකළ විට නිල් පැහැවීමට ගතවන කාලය අඩුවේද? වැඩිවේද? නැතහොත් වෙනස් නොවේද යන්න සඳහන් කරන්න.

a) පද්ධතියේ උෂ්ණත්වය වැඩිකිරීම.

b) $Na_2S_2O_3$ සාන්ද්‍රණය වැඩිකිරීම.

c) $H_2O_2$ සාන්ද්‍රණය වැඩිකිරීම.

(ලකුණු 8.0)

6) a) නියත උෂ්ණත්වයේදී ඝන NaOCl 14.9 g ක් නිවැරදිව කිරා 100 $cm^3$ ක ජලීය ද්‍රාවණයක් සාදා ගනී. NaOCl හි ප්‍රතිශත සංශුද්ධතාව (w/w) 90% බව අඩංගු වූ භාජනයේ සඳහන් වේ. HOCl 0.4 mol $dm^{-3}$ සාන්ද්‍රණයක් ඇති ද්‍රාවණයක් හා ඉහත NaOCl ද්‍රාවණයෙන් සම පරිමා මිශ්‍ර කරනු ලැබේ.

i) ඉහත ද්‍රාවණයේ ස්වාරක්ෂක ක්‍රියාව සරලව විස්තර කරන්න.

ii) NaOCl ද්‍රාවණයේ ආරම්භක සාන්ද්‍රණය සොයන්න.

iii) HOCl හි විඝටන නියතය (Ka) එම නියත උෂ්ණත්වයේදී $2 \times 10^{-4}$ mol $dm^{-3}$ වේ. ඉහත සාදාගත් මිශ්‍රණයේ pH ගණනය කරන්න.

ඉහත ද්‍රාවණයේ HOCl හි සාන්ද්‍රණය 0.2 mol $dm^{-3}$ ලෙස නියතව පවතින පරිදි නවීන ප්‍රතිආසෘතිය (Reverse – osmosis) ක්‍රමයක් මගින් $ClO^-$ හා $Na^+$ ඉවත් කරනු ලැබේ. ඉන්පසු දුර්වල අම්ලයක් වන 2 mol $dm^{-3}$ HA (විඝටන නියතය $K_a = 2 \times 10^{-5}$ mol $dm^{-3}$) සම පරිමාවක් මිශ්‍ර කරනු ලැබේ. පරීක්ෂණය එම උෂ්ණත්වයේදීම සිදුකරන ලදී. (Cl – 35.5, Na – 23, O – 16)

iv) නව pH අගය සොයන්න.

v) $ClO^-$ හා $A^-$ සාන්ද්‍රණ ගණනය කරන්න.

vi) මෙම ගණනය කිරීමේදී පරිමා ආශ්‍රිත උපකල්පනයක් ලියන්න.

(ලකුණු 8.5)

b) $2 \times 10^{-5}$ mol $dm^{-3}$ $MgCl_2$ ද්‍රාවණයකින් හා 0.2 mol $dm^{-3}$ ජලීය $NH_3$ ද්‍රාවණයකින් සම පරිමා මිශ්‍ර කරන ලදී. නියත උෂ්ණත්වයේදී $K_{SP}(Mg(OH)_2)$ හා $K_b(NH_4OH)$ පිළිවෙලින් $1.8 \times 10^{-11}$ $mol^3$ $dm^{-9}$ හා $1.8 \times 10^{-5}$ mol $dm^{-3}$ ලෙස දී ඇත.

i) ඉහත මිශ්‍රණයේ $OH^-$ සාන්ද්‍රණය ගණනය කරන්න.

ii) $Mg(OH)_2$ අවක්ෂේප වේද නොවේද යන්න ගණනයකින් නිගමනය කරන්න.

(ලකුණු 3.5)



Scanned with CamScanner

c) i) B ද්‍රාව්‍යයක් A නම් ද්‍රාවකයේ දිය කිරීමෙන් ද්‍රාවණයක් සාදා ගනී. A ද්‍රාවකයේ සංතෘප්ත වාෂ්ප පීඩනය $P_A^0$ ද, B ද්‍රාව්‍යයේ මවුල භාගය $x_B$ ද ද්‍රාවණයේ වාෂ්ප පීඩනය $P_A$ ද නම් රවුල් නියමය ඇසුරින් පහත සම්බන්ධතාවය ලබා ගන්න.

$$x_B = \frac{P_A^0 - P_A}{P_A^0}$$

ii) නියත උෂ්ණත්වයේදී (25°C) HOCl ජලීය ද්‍රාවණයක් සාදා ගැනීම සඳහා HOCl 5.25 g ක් ජලය 100 g ක අඩංගු කරයි. එම උෂ්ණත්වයේදී ජලයේ සංතෘප්ත වාෂ්ප පීඩනය $2.3 \times 10^3$ Pa වේ. ඒ අනුව ඉහත ද්‍රාවණයේ වාෂ්ප පීඩනය සොයන්න. [H – 1, O – 16, Cl – 35.5] එම තත්වයේදී HOCl විඝටනය 90% ක් වේ. මෙහිදී ජලය පමණක් වාෂ්ප පීඩනයට බලපාන බව සලකන්න.

(ලකුණු 3.0)

7) a) ලෙඩ් ඇකියුම්ලේටරය හෙවත් ඊයම් සංචායක කෝෂය එදිනෙදා බහුලව භාවිතා වන ද්විතියික කෝෂයකි.

i) ද්විතියක කෝෂයක් යනු කුමක් ද?

ii) මෙම කෝෂය විසර්ජනයේදී ඇනෝඩයේ හා කැතෝඩයේ සිදුවන ප්‍රතික්‍රියා වෙන වෙනම ලියා දක්වන්න.

iii) කෝෂය ආරෝපනයේදී සිදුවන ප්‍රතික්‍රියාව ලියා දක්වන්න.

(ලකුණු 2.0)

b) Aluminium bronze යනු විඛාදන ප්‍රතිරෝධී ගුණ ඇති Al හා Cu පමණක් අඩංගු මිශ්‍ර ලෝහයකි. එය ආභරන නිපදවීමට, ගිටාර තන්තු (guitar strings) නිපදවීමට භාවිතා කරයි. පහත දක්වෙන්නේ ගිටාර් තන්තුවක ලෝහ සංයුතිය සෙවීමට භාවිතා කළ විද්‍යුත් විච්ඡේදන ක්‍රමයකි.




ඇනෝඩයේදී වායු බුබුළු ... සිදු වේ.

ස්කන්ධය 3.70 g වූ ගිටාර් තන්තුව සම්පූර්ණයෙන්ම ද්‍රාවණගත වන තෙක් පමණක් විද්‍යුත් විච්ඡේදනය කිරීම සඳහා තත්පර 9650 ක කාලයක් වැය විය. මෙහිදී ඇනෝඩ කුර මත දී ජල විඡේදනය නොවන අතර ඒ මත කිසිවක් තැම්පත් නොවන බව සලකන්න.

i) ඇනෝඩීය ප්‍රතික්‍රියාව / ප්‍රතික්‍රියා ලියන්න.

ii) කැතෝඩීය ප්‍රතික්‍රියාව ලියන්න.

iii) විද්‍යුත් විච්ඡේදනයෙන් පසු ප්‍රතිඵල වූ ද්‍රාවණය 250.0 cm$^3$ වන තෙක් නැවත තනුක $H_2SO_4$ එකතු කර ද්‍රාවණයෙන් 50.0 cm$^3$ ගෙන එයට KI 0.5 g එකතු කර සාන්ද්‍රණය 0.2 mol dm$^{-3}$ වූ $Na_2S_2O_3$ ද්‍රාවණයක් සමග පිෂ්ඨය හමුවේ අනුමාපනය කරන ලදී. වැයවූ $Na_2S_2O_3$ පරිමාව 20.0 cm$^3$ කි. ඉහත දත්තවලට අනුව ගිටාර් තන්තුවේ Cu ස්කන්ධ ප්‍රතිශතය

(Cu – 63.5, Al = 27)

iv) සම්පූර්ණ විද්‍යුත් විච්ඡේදනය සඳහා තත්පර 9650 ක කාලයක් ගතවිනි නම් ගලාගිය ඒකාකාර ධාරාව ගණනය කරන්න. (1F = 96500 Cmol$^{-1}$)

v) කැතෝඩයේ දී පිටවූ වායුව පරිපූර්ණ බව උපකල්පනය කර ස.උ.පී. දී එහි පරිමාව ගණනය කරන්න. (ස.උ.පී. දී පරිපූර්ණ වායුවක මවුලික පරිමාව 22.4 dm$^3$ mol$^{-1}$)

(ලකුණු 8.0)



Scanned with CamScanner

c) M නම් ලෝහය අඩංගු ලෝපස් නිදර්ශකයකින් 2.0 g ගෙන තනුක අම්ල යොදා එහි අඩංගු ලෝහ අයන ද්‍රාවණ ගත කරන ලදී. පරිමාව 250 $cm^3$ වූ එම ද්‍රාවණය X නම් වන අතර එය පහත පරීක්ෂාවලට භාජනය කර M හි කැටායනය / කැටායන හඳුනා ගැනීමට තැත් කරන ලදී.




i) ලෝපස් තුළ අඩංගු M හි කැටායනය / කැටායන මොනවා ද?

ii) A, B, හා C අවක්ෂේපවල සූත්‍ර ලියන්න.

iii) පොටෑසියම් අඩංගු D සංයෝගයේ සූත්‍රය හා IUPAC නම ලියන්න.

iv) X ද්‍රාවණය තුළ M හි අවම ඔක්සිකරණ අංකයෙන් යුත් කැටායනය අන්තර්ගත වේ නම් එය ප්‍රමාණාත්මකව නිර්ණය කිරීමට පරිමාමිතික ක්‍රමයක් ගණනය සහිතව ඉදිරිපත් කරන්න. මේ සඳහා පහත දී ඇති ලැයිස්තුවෙන් සුදුසු ප්‍රතිකාරක තෝරා ගන්න. ප්‍රාමාණික $KMnO_4$, $Na_2S_2O_3$, තනුක $H_2SO_4$, KI, $H_3PO_4$.

(ලකුණු 5.0)

## C කොටස

8) a) i) කාබනික සංයෝග ලෙස $CH_3COCl$ හා



භාවිතා කරමින් පහත දී ඇති සංයෝගය



සංස්ලේෂණය කරන්න. A, B, C, D, E, F, G සංයෝගවල ව්‍යුහ ඇඳීමෙන් හා සුදුසු ප්‍රතිකාරක භාවිතා කරමින් පරිවර්තනය සම්පූර්ණ කරන්න.

(

බව සලකන්න.)

Scanned with CamScanner



ii) පහත පරිවර්තන සම්පූර්ණ කරන්න.

I) 

II) 

(ලකුණු 7.0)

b) i) එකම කාබනික ආරම්භක සංයෝගය $H-C\equiv C-H$ ලෙස ගෙන $CH_3-\underset{H}{C}=\underset{H}{C}-CH_2-O-CH_3$ පිළියෙල කරන්න. මේ සඳහා පහත ප්‍රතිකාරක පමණක් භාවිත කරන්න.

[$HgSO_4$, ජලය, සාන්ද්‍ර $H_2SO_4$, තනුක $NaOH$, $Na$, $NaBH_4$, $CH_3Cl$ ]



Scanned with CamScanner

ii) I. $CH_3-C\equiv C^-:Na^+$ හොඳ නියුක්ලියොෆයිලයක් මෙන්ම භෂ්මයක් වන්නේ යැයි සිතන්න. එසේනම් එය $CH_3-CH_2-Cl$ සමග ප්‍රතික්‍රියාවෙන් සෑදෙන ඵල වෙන වෙනම ලියන්න.

II. I ප්‍රතික්‍රියාව සඳහා සුදුසු යාන්ත්‍රන දෙකක් ලියන්න. ඔබ ලියන ලද යාන්ත්‍රන දෙක කුමන වර්ගයේ ප්‍රතික්‍රියාදැයි සඳහන් කරන්න. (ලකුණු 6.0)

c) මෙතිල් ඇමීන් ($CH_3NH_2$) හා මෙතනෝල් ($CH_3OH$) අතරින් වඩා භාෂ්මික වන්නේ කුමක් ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 2.0)

9) a) i) පහත රූපයේ A සිට P තෙක් සංයෝගවල රසායනික සූත්‍ර ලියන්න. (තුලිත රසායනික සමීකරණ සහ හේතු දැක්වීම අවශ්‍ය නොවේ) මෙහි ඝන අවක්ෂේප, ද්‍රාවණ හා වායු නිරූපනය කිරීමට පහත දක්වෙන සංකේත භාවිතා කෙරේ.




ii) A සංයෝගයේ පවතින ලෝහයේ භූමි අවස්ථාවේ ඉලෙක්ට්‍රොනික වින්‍යාසය ලියන්න.

iii) N වල රසායනික ගුණ සඳහන් කරන්න.

iv) F, G බවට පත්වීමේදී N හි කාර්ය සඳහන් කරන්න. (ලකුණු 7.0)

Scanned with CamScanner

b) ස්වල්ප ලෙස ආම්ලික ජලීය ද්‍රාවණයක $Fe^{2+}$, $C_2O_4^{2-}$ හා $SO_3^{2-}$ පවතී. මෙම එක් එක් අයනයේ සාන්ද්‍රණය නිර්ණය කිරීම සඳහා පහත දක්වෙන ක්‍රියා පිළිවෙල යොදා ගන්නා ලදී.

ද්‍රාවනයෙන් 25.0 $cm^3$ පරිමාවක් ගෙන එය සාන්ද්‍රණය 0.04 $mol\ dm^{-3}$ වූ ආම්ලික $KMnO_4$ ද්‍රාවනයක් සමග අනුමාපනය කරන ලදී. එහිදී ලැබුනු බියුරෙට්ටු පාඨාංකය 32.5 $cm^3$ විය.
මෙම ද්‍රාවණයටම වැඩිපුර $BaCl_2$ ද්‍රාවනයක් එකතු කරන ලදී. එවිට අවක්ෂේපයක් ලැබුණි. මෙය පෙරා වියලා ගන්නා ලදී. ස්කන්ධය 0.35 g විය.
අනතුරුව පෙරනය ගෙන එයට වැඩිපුර KI ද්‍රාවනයක් එකතු කර සමස්ත පරිමාව 100 $cm^3$ වන තෙක් ජලයෙන් තනුක කරන ලදී. ඉන් 25 $cm^3$ ක් ගෙන සාන්ද්‍රනය 0.05 $mol\ dm^{-3}$ වූ $Na_2S_2O_3$ සමග අනුමාපනය කරන ලදී. වැයවූ පරිමාව 7.5 $cm^3$ විය. (Ba – 137, S – 32, O – 16, C – 12)

i) සිදුවන සියලුම ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.
ii) ද්‍රාවනයේ අඩංගු $Fe^{2+}$, $C_2O_4^{2-}$ සහ $SO_3^{2-}$ අයනවල සාන්ද්‍රණ ගණනය කරන්න.

(ලකුණු 8.0)

10) a) සොල්වේ ක්‍රමයෙන් $Na_2CO_3$ නිෂ්පාදනයට අදාල ගැලීම් සටහනක් පහත දක්වේ. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- $R_1$ හා $R_2$ අමුද්‍රව්‍ය වේ.
- $M_1, M_2, M_3, M_4$ ප්‍රධාන පියවර වේ.
- $S_1, S_2$ ක්‍රියාවලිය තුළ නිපදවන ද්‍රව්‍ය වේ.
- $P_1$ හා $P_2$ පිළිවෙලින් ප්‍රධාන ඵලය හා වැදගත් අතුරුඵලය




i) $R_1$ හා $R_2$ අමුද්‍රව්‍ය හඳුනා ගන්න.
ii) $M_1, M_2, M_3, M_4$ ප්‍රධාන පියවර නම් කරන්න.
iii) $P_1$ හා $P_2$ හඳුනා ගන්න.
iv) සොල්වේ ක්‍රමයේ භාවිතා කරන එක් එක් අමුද්‍රව්‍ය ලබාගන්නා ක්‍රම වෙන් වෙන්ව සඳහන් කරන්න.



Scanned with CamScanner

v) $M_1$ හා $M_2$ පියවර වලදී භාවිතා කරන භෞතික රසායනික මූලධර්ම 3ක් හේතු සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

vi) පහත අවස්ථාවන්ට අදාල තුලිත රසායනික සමීකරණ ලියන්න.

I) $M_3$ පියවර

II) $M_4$ පියවර

III) A පියවර

IV) B පියවර

vii) සොල්වේ ක්‍රමය ආර්ථික වශයෙන් වාසිදායක වීමේ ප්‍රධාන කරුණු 3ක් සඳහන් කරන්න.

(ලකුණු 6.5)

b) යකඩ නිස්සාරණය ඇසුරින් අසා ඇති පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i) යකඩ නිස්සාරණ ක්‍රියාවලිය කාර්යක්ෂම කර ගැනීම සඳහා සැලකිලිමත් විය යුතු කරුණු 4ක් ලියන්න.

ii) ධාරා ඌෂ්මකය තුළදී කෝක් ඉටුකරන කාර්යයන් 3ක් ලියන්න. ඊට අදාල තුලිත සමීකරණ ලියන්න.

iii) ලෝබොර ලෙස හැඳින්වෙන ප්‍රධාන රසායනික විශේෂ 2ක් ලියන්න.

iv) ඉහත සඳහන් රසායනික විශේෂ දෙක සෑදෙන ආකාරය ප්‍රතික්‍රියා මගින් පෙන්වා දී ලෝබොර වල කාර්යය කෙටියෙන් පැහැදිලි කරන්න.

v) ධාරා ඌෂ්මකය තුළ පහත අවස්ථාවන්ට අදාල තුලිත රසායනික සමීකරණ ලියන්න.

I) 1000°C ට වඩා ඉහළ උෂ්ණත්වයන් සහිත ප්‍රදේශයේ

II) 1000°C ට වඩා පහළ උෂ්ණත්වයන් සහිත ප්‍රදේශයේ

(ලකුණු 4.5)

c) ශ්‍රී ලංකාවේ මෑතකදී සිදුවූ විශාලතම පාරිසරික හානිය වූයේ 2021 මැයි 26 කොළඹ වරායට නුදුරින් මුහුදේ දී X – PRESS PEARL නෞකාව ගිනිගැනීම වේ.
මෙම නෞකාවෙහි ප්‍රවාහනය කරමින් තිබූ ද්‍රව්‍ය අතරින් පාරිසරික දූෂක කාර්යයන්ට අදාල රසායනික සංයෝග කීපයක් දක්නට ලැබුණි. ඒවා නම් $HNO_3$, NaOH, $H_2SO_4$ හා Plastic Pellets වේ. මෙයට අමතරව ඒ වනවිට නැවේ සංචිත ලෙසට තෙල් ටොන් 350ක් පමණ තිබුණි. නැව ගිනි ගැනීම නිසා ඉහත කී ද්‍රව්‍ය නොයෙක් ආකාරයට වායුගෝලයට පසට හා මුහුදු ජලයට එකතු වී විශාල පාරිසරික හානියක් සිදුවිය.

i) I) මින් නිකුත්වන අම්ල වැසි සඳහා බලපාන දූෂක කාරක දෙකක් සඳහන් කරන්න.

II) ඉහත (I) හි සඳහන් පිළිතුරට අදාල දූෂක කාරක නිපදවන්නේ කෙසේදැයි තුලිත සමීකරණ මගින් දක්වන්න.

III) අම්ල වැස්සෙහි ප්‍රතිවිපාක තුනක් සඳහන් කරන්න.

IV) ගෝලීය උණුසුමට බලපාන ඉන් නිකුත්වන වායුවක් සඳහන් කරන්න.

V) එම වායු වර්ගය කුමන ද්‍රව්‍යයන් (ඉහත සඳහන් ද්‍රව්‍ය අතරින්) දහනයේ දී නිකුත් වන්නේ ද?

VI) එම වායු වර්ගය අම්ල වැසි සඳහා දායක නොවන බව සනාථ කරන්න.

VII) ඉහත සඳහන් සංයෝග දහනයේ දී පිටකරන වායුවර්ග නිසා මිනිසාට සෑදිය හැකි එක් රෝගයක් සඳහන් කරන්න.

ii) $HNO_3$ NaOH, $H_2SO_4$ මුහුදු ජලයේ දියවීම නිසා සිදුවිය හැකි දුර්විපාක 4ක් සඳහන් කරන්න.

iii) Plastic Pellets හේතුවෙන් සතුන්ට සහ පරිසරයට සිදුවන බලපෑම් 2ක් සඳහන් කරන්න.

(ලකුණු 5.0

Scanned with CamScanner

# ආවර්තිතා වගුව

# The Periodic Table

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1 H | | | | | | | | | | | | | | | | | 2 He |
| 2 | 3 Li | 4 Be | | | | | | | | | | | 5 B | 6 C | 7 N | 8 O | 9 F | 10 Ne |
| 3 | 11 Na | 12 Mg | | | | | | | | | | | 13 Al | 14 Si | 15 P | 16 S | 17 Cl | 18 Ar |
| 4 | 19 K | 20 Ca | 21 Sc | 22 Ti | 23 V | 24 Cr | 25 Mn | 26 Fe | 27 Co | 28 Ni | 29 Cu | 30 Zn | 31 Ga | 32 Ge | 33 As | 34 Se | 35 Br | 36 Kr |
| 5 | 37 Rb | 38 Sr | 39 Y | 40 Zr | 41 Nb | 42 Mo | 43 Tc | 44 Ru | 45 Rh | 46 Pd | 47 Ag | 48 Cd | 49 In | 50 Sn | 51 Sb | 52 Te | 53 I | 54 Xe |
| 6 | 55 Cs | 56 Ba | La-Lu | 72 Hf | 73 Ta | 74 W | 75 Re | 76 Os | 77 Ir | 78 Pt | 79 Au | 80 Hg | 81 Tl | 82 Pb | 83 Bi | 84 Po | 85 At | 86 Rn |
| 7 | 87 Fr | 88 Ra | Ac-Lr | 104 Rf | 105 Db | 106 Sg | 107 Bh | 108 Hs | 109 Mt | 110 Uun | 111 Uuu | 112 Uub | 113 Uut | ... | | | | |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 57 La | 58 Ce | 59 Pr | 60 Nd | 61 Pm | 62 Sm | 63 Eu | 64 Gd | 65 Tb | 66 Dy | 67 Ho | 68 Er | 69 Tm | 70 Yb | 71 Lu |
| 89 Ac | 90 Th | 91 Pa | 92 U | 93 Np | 94 Pu | 95 Am | 96 Cm | 97 Bk | 98 Cf | 99 Es | 100 Fm | 101 Md | 102 No | 103 Lr |

Scanned with CamScanner

දේවි බාලිකා විද්‍යාලය - කොළඹ

**DEVI BALIKA VIDYALAYA – COLOMBO**

**13 වන ශ්‍රේණිය තෙවන වාර පරීක්ෂණය - 2021 දෙසැම්බර්**

Grade 13 Third Term Test – December 2021

| | | |
|---|---|---|
| රසායන විද්‍යාව II<br>Chemistry II | 02 S II | පැය තුනයි<br>Three hours |

**A කොටස - ව්‍යුහගත රචනා**

ප්‍රශ්න හතරටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්න සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 10 කි.)

01) a) පහත දක්වෙන ප්‍රශ්නවලට තිත් ඉරි මත පිළිතුරු සපයන්න.

i) $AlCl_3$, $Al_2O_3$ සහ $Al(OH)_3$ යන සංයෝග අතුරෙන් වඩාත්ම අයනික වන්නේ කුමක් ද?

..

ii) $F_2$, $Cl_2$ සහ $Br_2$ යන අණු තුන අතුරෙන් අඩුම බන්ධන විඝටන ශක්තිය ඇත්තේ කුමනටද?

......

iii) $CBrI_3$, $CBr_4$ සහ $CICl_3$ යන සංයෝග අතුරෙන් වැඩිම තාපාංකයක් ඇත්තේ කුමකටද?

... ....

iv) Sc, Ni සහ Zn යන මූලද්‍රව්‍ය අතුරෙන් අඩුම පරමාණුක අරය ඇත්තේ කුමකටද?.. ..

v) P, S, Cl යන මූලද්‍රව්‍ය අතුරෙන් අඩුම විද්‍යුත් සෘණතාවයක් ඇත්තේ කුමකටද? ................

vi) $H_2PO_2^-$, $HPO_3^{2-}$ සහ $PO_4^{3-}$ යන අයන අතුරෙන් වැඩිම $P-O$ බන්ධන දිග ඇත්තේ කුමනටද?

(ලකුණු 2.0)

b) i) අණුක සූත්‍රය $C_3H_3NO$ සංයෝගය සඳහා වඩාත්ම පිළිගත හැකි ලුවිස් තිත්-ඉරි ව්‍යුහය අඳින්න. එහි සැකිල්ල පහත දක්වා ඇත. හයිඩ්‍රජන් පරමාණු සම්බන්ධ වී ඇත්තේ එකිනෙකට යාබද කාබන් පරමාණු දෙක මත පමණි.

$$C-C-N-C-O$$

ii) මෙම සංයෝගය සඳහා තවත් ලුවිස් තිත්-ඉරි ව්‍යුහ (සම්ප්‍රයුක්ත ව්‍යුහ) තුනක් අඳින්න. ඉහත (i) හි අඳින ලද වඩාත්ම පිළිගත හැකි ව්‍යුහය සමග සංසන්දනය කිරීමේදී ඔබ විසින් අඳින ලද ව්‍යුහවල සාපේක්ෂ ස්ථායිතාවයන් සඳහන් කිරීමට එම ව්‍යුහ යටින් 'අඩු ස්ථායි' හෝ 'අස්ථායි' වශයෙන් ලියා දක්වන්න.



Scanned with CamScanner

iii) පහත සඳහන් ලුවිස් තිත්-ඉරි ව්‍යුහය සහ එහි අංකනය කරන ලද සැකිල්ල පදනම් කරගෙන දී ඇති වගුව සම්පූර්ණ කරන්න.





| | $N^1$ | $N^2$ | $C^3$ | $S^4$ |
|---|---|---|---|---|
| පරමාණුව වටා VSEPR යුගල් | | | | |
| පරමාණුව වටා ඉලෙක්ට්‍රෝන යුගල් ජ්‍යාමිතිය | | | | |
| පරමාණුව වටා හැඩය | | | | |
| පරමාණුවේ මුහුම්කරණය | | | | |
| විධිමත් ආරෝපණය | | | | |
| ඔක්සිකරණ අංකය | | | | |

කොටස් (iv) සිට (vii) ප්‍රශ්න ඉහත (iii) කොටසෙහි දෙන ලද ලුවිස් තිත් ඉරි ව්‍යුහය මත පදනම් වේ. පරමාණු ලේබල් කිරීම (iii) කොටසෙහි ආකාරයටම වේ.

iv) පහත දක්වෙන පරමාණු දෙක අතර σ බන්ධන සෑදීමට සහභාගි වන පරමාණුක / මුහුම් කාක්ෂික හඳුනා ගන්න.

| | | | |
|---|---|---|---|
| I. | $O - N^1$ | O ........ | $N^1$ ........ |
| II. | $N^1 - H$ | $N^1$ ........ | H ........ |
| III. | $N^1 - N^2$ | $N^1$ ........ | $N^2$ ........ |
| IV. | $N^2 - C^3$ | $N^2$ ........ | $C^3$ ........ |
| V. | $C^3 - S^4$ | $C^3$ ........ | $S^4$ ........ |
| VI. | $S^4 - Br$ | $S^4$ ........ | Br ........ |

v) පහත දක්වෙන පරමාණු දෙක අතර π බන්ධන සෑදීමට සහභාගි වන පරමාණුක කාක්ෂික හඳුනා ගන්න.

$N^2 - C^3$ $N^2$ .............. $C^3$ ..............

vi) $N^1$, $N^2$, $C^3$ සහ $S^4$ පරමාණු වටා ආසන්න බන්ධන කෝණ සඳහන් කරන්න.

$N^1$ .................. $N^2$ .................. $C^3$ .................. $S^4$ ..................

vii) $N^1$, $N^2$ සහ $C^3$ පරමාණු විද්‍යුත් සෘණතාව වැඩිවන පිළිවෙලට සකසන්න.

.................. < .................. < ..................

(ලකුණු 6.0)



Scanned with CamScanner

c) i) පරමාණුක කාක්ෂිකයක් විස්තර කිරීමට n, $l$ හා $m_l$ යන ක්වොන්ටම් අංක යොදා ගනී. පහත කොටු තුළ අදාළ ක්වොන්ටම් අංක හා පරමාණු කාක්ෂිකයේ නම ලියන්න.

| | n | $l$ | $m_l$ | පරමාණුක කාක්ෂිකය |
|---|---|---|---|---|
| I | 4 | 2 | +1 | [ ] |
| II. | [ ] | [ ] | [ ] | 3s |
| III. | [ ] | [ ] | −1 | 2p |

ii) පහත සඳහන් I, II හා III යන පද්ධති වල ප්‍රධාන අන්තර් අණුක බල වර්ගය / වර්ග සඳහන් කරන්න.

I. $CH_3COCH_3(aq)$ ද්‍රාවණය

II. $O_3$ වායුව

III. $KI_3(aq)$ ද්‍රාවණය

.....

(ලකුණු 2.0) 100

02) a) A හා B යනු ආවර්තිතා වගුවේ තුන්වන ආවර්තයේ මූලද්‍රව්‍ය දෙකකි. A තනුක HCl හා තනුක NaOH යන දෙක සමග වෙන වෙනම ප්‍රතික්‍රියා කර අවර්ණ ගඳක් නොමැති එකම ද්වි පරමාණුක වායුව පිට කරයි. B බහුරූප ආකාර සහිත මූලද්‍රව්‍යයක් වන අතර, තනි බන්ධන සහිත බහු පරමාණුක අණුවක් ලෙස ස්වභාවයේ පවතී. එමෙන්ම B නිල් දැල්ලක් සහිතව දැවේ.

i) A හා B හඳුනා ගන්න.

A .......... .................... B ...... ..................................

ii) A හා B භූමි අවස්ථාවේ ඉලෙක්ට්‍රෝන වින්‍යාසය ලියන්න.

A .. ..... B ..

iii) A හා B වල සුලභ ඔක්සිකරණ අංකය / අංක සඳහන් කර ඒවායේ උපරිම ඔක්සිකරණ අවස්ථාව සඳහා උදාහරණය බැගින් ඉදිරිපත් කරන්න.

| | ඔක්සිකරණ අංකය / අංක | උදාහරණ |
|---|---|---|
| A | | |
| B | | |

iv) A හි වඩාත්ම ස්ථායි ඔක්සිකරණ අවස්ථාවේ ක්ලෝරයිඩ ලවණය සෑදන ජලීය ද්‍රාවණයේ ස්වභාවය ආම්ලික ද / භාෂ්මිකද / උදාසීන ද යන්න සඳහන් කරන්න. ....................................

v) ඔබේ පිළිතුර සනාථ කිරීම සඳහා සරල පරීක්ෂණයක් යෝජනා කරන්න. නිරීක්ෂණය සඳහන් කරන්න.

පරීක්ෂණය .

නිරීක්ෂණය.......

................

vi) ඉහත (iv) කොටසේ සඳහන් පිළිතුර තුලිත අයනික සමීකරණය / සමීකරණ මගින් පෙන්වා දෙන්න.

.......................

...............................

vii) B හි ස්ථායි බහු පරමාණුක අණුක ව්‍යුහය සහ ස්ථායි බහුරූපී ආකාරයේ ව්‍යුහය අඳින්න.

| | |
|---|---|
| | |
| ස්ථායි බහු පරමාණුක අණුක ව්‍යුහය | ස්ථායි බහුරූපී ආකාරයේ ව්‍යුහය |

viii) P හා Q යනු B අඩංගු අවර්ණ ආම්ලික වායු 2 කි. P හා Q ට ඔක්සිහරණ / ඔක්සිකාරක හැකියාව ඇත. P හා Q ආවේණික ගන්ධයක් සහිත වේ. P ජලයේ මද වශයෙන් දියවන අතර Q ජලයේ හොඳින් දියවේ.

I) P හා Q හඳුනා ගන්න.

P .......... Q .....

P හා Q ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| | | P | Q |
|---|---|---|---|
| II) | ලුවිස් ව්‍යුහය | | |
| III) | බන්ධන කෝණය (සාපේක්ෂව අඩු / වැඩි) | | |
| IV) | ඔක්සිකාරක ගුණය පෙන්වීමට තුලිත සමීකරණය | | |
| V) | ඔක්සිහාරක ගුණය පෙන්වීමට තුලිත සමීකරණය | | |
| VI) | වෙන්කර හඳුනා ගැනීම සඳහා පරීක්ෂණයක් | | |

(ලකුණු 7.0)



Scanned with CamScanner

b) පහත ගැලීම් සටහන s ගොනුවට අයත් මූලද්‍රව්‍යයක X නම් ලවණයක් සඳහා කරන ලද පරීක්ෂණයක් හා සම්බන්ධ වේ. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i) X ලවණය හඳුනා ගන්න. ............................................

ii) $P_1$, $P_2$, $P_3$, $P_4$, $P_5$ රසායනික සංයෝග හඳුනා ගන්න.

$P_1$ ........................ $P_2$ ........................ $P_3$ ........................

$P_4$ ........................ $P_5$ ........................

iii) $P_2$ වායුවේ හා $P_3$ හි ඝනයෙහි භාවිතය බැගින් ලියන්න.

..............................................................................................

iv) (1) හා (2) අවස්ථා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

(1) ..............................

..............................

(ලකුණු 3.0) 100



Scanned with CamScanner

03) a) 0.2 mol $dm^{-3}$ NaOH ද්‍රාවණයකින් 25.0 $cm^3$ ක් ආසුත ජලය 75.0 $cm^3$ සමඟ මිශ්‍ර කර සාදාගත් ද්‍රාවණයක, ඝන $Ca(OH)_2$ දිය කිරීමෙන් සංතෘප්ත ද්‍රාවණයක් (A) සාදා ගන්නා ලදී (25 °C හිදී). ඉන් 25.00 $cm^3$ ක් අනුමාපන ප්ලාස්කුවකට ගෙන 0.1 mol $dm^{-3}$ HCl ද්‍රාවණයක් මගින් අනුමාපනය කරනු ලැබේ. වැයවූ HCl පරිමාව 14.00 $cm^3$ කි.

i) A ද්‍රාවණයෙහි සමස්ථ $OH^-$ සාන්ද්‍රණය ගණනය කරන්න.

.................

.................................................................................... .....

ii) A ද්‍රාවණයෙහි $Ca^{2+}$ සාන්ද්‍රණය ගණනය කරන්න.

.......................................................................

.........

.......................................................................

.....

iii) ඉහත උෂ්ණත්වයේදී $Ca(OH)_2$ හි $K_{SP}$ ගණනය කරන්න.

........................................

............................

.........  ..............

iv) ඉහත උෂ්ණත්වයේදී NaOH ද්‍රාවණය තුළ $Ca(OH)_2$ හි ද්‍රාව්‍යතාව $mgdm^{-3}$ වලින් ගණනය කරන්න. (Ca – 40, O – 16, H – 1)

.............................................

..................

...............

v) ජලය තුළදී $Ca(OH)_2$ හි ද්‍රාව්‍යතාවය ඉහත (iv) හි ගණනය කළ අගයට වඩා අඩුවේද වැඩිවේද යන්න හේතු දක්වමින් සඳහන් කරන්න.

................................  ..............

Scanned with CamScanner

vi) ඝන $Ca(OH)_2$ 0.01 mol $dm^{-3}$ $HNO_3$ ලීමිත පරිමාවක් තුළ දිය කිරීමෙන් සංතෘප්ත ද්‍රාවණයක් සාදන ලදී. ඉන් 25 $cm^3$ ක් ~~0.01~~ 0.1 mol $dm^{-3}$ HCl මගින් අනුමාපනය කිරීමේදී වැයවන HCl පරිමාව ගණනය කරන්න.

(ලකුණු 7.0)

b) MX(s) 0.1 mol ජලයේ දියකර 100 $cm^3$ ක ද්‍රාවණයක් 27 °C හිදී සාදන ලදී. එහිදී ද්‍රාවණයේ උෂ්ණත්වය 7°C කින් ඉහළ යන ලදී.

ද්‍රාවණයෙහි ඝනත්වය හා විශිෂ්ට තාප ධාරිතාව පිළිවෙලින් 1.00 g $cm^{-3}$ හා 4.2 J $g^{-1}$ $°C^{-1}$ වේ.

i) $MX(s) + H_2O(l) \longrightarrow M^+(aq) + X^-(aq)$ යන ප්‍රතික්‍රියාව ආශ්‍රිත එන්තැල්පි විපර්යාසය ගණනය කරන්න.

ii) MX(s) ජලයෙහි ද්‍රවණය වීම සඳහා එන්ට්‍රොපි විපර්යාසය (ΔS) 250 J $mol^{-1}$ $K^{-1}$ නම් MX(s) ජලයේ ද්‍රවණය වීම අදාල ΔG 27 °C හිදී ගණනය කරන්න.

iii) එනයින් 27 °C හිදී MX(s) ද්‍රාවණය වීමේ ස්වයංද්‍රධතාවය පුරෝකථනය කරන්න.

(ලකුණු 3.0) 100



Scanned with CamScanner

4. (a) A, B, C , D හා E යනු අණුක සූත්‍රය $C_5H_{12}O$ වන ව්‍යුහ සමාවයවික වේ. මේවායින් A, B, හා C පමණක් ප්‍රකාශ සමාවයවිකතාව පෙන්වයි.

ඉහත සමාවයවික අතුරින් D පමණක් ආම්ලික $KMnO_4$ සමඟ ඔක්සිකරණය කළ නොහැක. A, B, C, හා D සාන්ද්‍ර $H_2SO_4$ සමඟ පිරියම් කළවිට, A මගින් P ද B මගින් Q ද C හා D මගින් එකම R සංයෝගය ද ලැබේ. E සාන්ද්‍ර $H_2SO_4$ සමඟ ප්‍රතික්‍රියාවෙන් විජලනයට ලක් නොවේ. P, Q, හා R, HBr සමඟ ප්‍රතික්‍රියාවෙන් P මගින් X සංයෝගය ද Q හා R මගින් එකම Y සංයෝගය ද ලැබේ.

(i) A, B, C, D හා E වල ව්‍යුහයන් පහත දී ඇති කොටු තුළ අඳින්න.

| A | B | C |
|---|---|---|
| | | |

| D | E |
|---|---|
| | |

(ii) P හි පවතින්නා වූ ත්‍රිමාන සමාවයවිකතාව කුමක්ද?

..................................

(iii) X හා Y වල ව්‍යුහයන් පහත කොටු තුළ අඳින්න.

| X | Y |
|---|---|
| | |

(iv) X හා Y එකිනෙකින් වෙන්කර හඳුනා ගැනීමට පරීක්ෂාවක් නම් කරන්න.

........

........

(ලකුණු 5.0)

b) (i) ? ඇති කොටු තුළ K, L, හා M සංයෝගවල ව්‍යුහ ඇඳීමෙන් සහ P, Q, හා R ප්‍රතිකාරක / උත්ප්‍රේරක දෙමින් පහත ? ඇති ප්‍රතික්‍රියා අනුක්‍රම සම්පූර්ණ කරන්න.

අනුක්‍රමය I

$CH_3-C\equiv C-CH_3 \xrightarrow[\text{(ප්‍රතික්‍රියා I)}]{P} CH_3-CO-CH_2-CH_3 \xrightarrow[\text{(ප්‍රතික්‍රියා II)}]{\text{(i) } LiAlH_4 \text{ (ii) } H^+ / H_2O} K$

P

K

අනුක්‍රමය II :




L

Q

M

අනුක්‍රමය III :

$CH_3CH_2C(=O)NH_2 \xrightarrow[\text{(ප්‍රතික්‍රියාව VI)}]{R} CH_3CH_2CH_2NH_2$

R

ii) ප්‍රතික්‍රියා I – VI අතුරෙන් තෝරාගනිමින් පහත දක්වා ඇති එක් එක් ප්‍රතික්‍රියා වර්ගය සඳහා එක් නිදසුනක් බැගින් දෙන්න.

නියුක්ලියෝෆිලික ආකලනය :

නියුක්ලියෝෆිලික ආදේශය :

(ලකුණු 5.0)

100



Scanned with CamScanner

# දේවි බාලිකා විද්‍යාලය- කොළඹ
# DEVI BALIKA VIDYALAYA– COLOMBO

මනසා සමුද්‍රා ධීරා
Manasa Samrudha Dheera

## 13 වන ශ්‍රේණිය දෙවන වාර පරීක්ෂණය - 2021 මාර්තු
## Grade 13 SecondTerm Test - March 2021

### B කොටස - රචනා

- ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නයට ලකුණු 15 බැගින් ලැබේ.)

(5). (a) පරිමාව 4.157 $dm^3$ ක් වන සංවෘත දෘඩ බඳුනකට M නම් ඝන සංයෝගයෙන් ස්වල්පයක්ද $N_2$ වායුවෙන් (නයිට්‍රජන්) 0.3 mol ක් ද එකතු කර පද්ධතියේ උෂ්ණත්වය 127 °C දක්වා ඉහළ නංවන ලදී. $N_2$ ප්‍රතික්‍රියා නොකරන අතර M ඝනය පහත පරිදි ආංශිකව වියෝජනය වී ගතික සමතුලිත වේ.

$$M(s) \rightleftharpoons P(g) + 2Q(g)$$

එවිට සමතුලිත පීඩනය $4.8 \times 10^5$ Pa විය.

(i) සමතුලිත පද්ධතිය තුළ ඇති $N_2$ වායුවේ ආංශික පීඩනය සොයන්න.

(ii) P හා Q වායූන්හි ආංශික පීඩන සොයන්න.

(iii) 127 °C දී ඉහත සමතුලිතතාවයට අදාළ Kp ගණනය කරන්න.

(iv) ඉහත පද්ධතියේ උෂ්ණත්වය 227 °C දක්වා වැඩි කළවිට සමතුලිත පද්ධතියේ පීඩනය $9 \times 10^5$ Pa වේ නම්, Kp ගණනය කිරීමකින් තොරව, ඉදිරි ප්‍රතික්‍රියාව තාපදායකද තාප අවශෝෂකද යනවග ගණනයකින් පෙන්වා දෙන්න.

(ලකුණු 6.0)

(b) 27 °C දී පරිමාව 1 $dm^3$ ක් වන සංවෘත බඳුනකට A නම් වායුවෙන් n ප්‍රමාණයක් (mol) ඇතුළු කර පහත පරිදි පද්ධතිය සමතුලිත වීමට ඉඩ තබන ලදී.

$$2A(g) \rightleftharpoons C_2(g) + B(g)$$

27 °C දී මෙම පද්ධතියේ Kc = 4 කි.

A(g) වායුව ඇතුළු කර විනාඩි පහකින් පද්ධතිය ගතික සමතුලිතතාවයට පත්විය.

(i) සමතුලිත පද්ධතියේ A(g) , $C_2(g)$ හා B(g) හි ප්‍රමාණයන් n ඇසුරින් ගණනය කරන්න.

(ii) මෙම පද්ධතිය සමතුලිතතාවයට පැමිණීමේදී කාලයත් සමග A, B හා $C_2$ වල සාන්ද්‍රණ විචලනය වන ආකාරය එකම ප්‍රස්ථාරයක් තුළ අඳින්න. (අක්ෂ නම් කිරීම, සංරචක හා එහි සංයුති සඳහන් කිරීම අනිවාර්ය වේ.)

(iii) ඉහත පද්ධතිය සමතුලිතතාවයට පැමිණ තවත් විනාඩි පහකට පසු උෂ්ණත්වය 27 °C දීම නියතව තබා පරිමාව අඩක් කරන ලදී. එවිට පද්ධතියේ.

(I) ඉදිරි සහ පසු ප්‍රතික්‍රියා වේග

(II) ඉදිරි සහ පසු ප්‍රතික්‍රියාවල වේග නියත

(III) සමතුලිත ලක්ෂ්‍යය හා සමතුලිත නියතය

කෙසේ වෙනස් වේදැයි සඳහන් කරන්න.

(iv) ඉහත (iii) කොටසේදී සිදු කළ වෙනස්කම හේතුවෙන් A(g) , B(g) හා $C_2(g)$ සාන්ද්‍රණ වෙනස් වන ආකාරය ඉහත ප්‍රස්ථාරය තුළම අඳින්න.

(ලකුණු 4.0)



Scanned with CamScanner

(c) 350 K උෂ්ණත්වයේදී 2AB(g) + $B_2$(g) + $C_2$(g) → $2AB_2C$(g) ΔH = (-) යන වායුමය ප්‍රතික්‍රියා යාන්ත්‍රණය පිළිබඳව අධ්‍යයනය කරන ලදී.
මෙම ප්‍රතික්‍රියාව පහත පරිදි මූලික පියවර තුනකින් සමන්විත බව තහවුරු විය. එම එක් එක් පියවරයන් ඒවායේ සීඝ්‍රතා නියතද පහත දක්වා ඇත.

පියවර 1 $AB(g) + B_2(g) \underset{k_b = 1 \times 10^4\ s^{-1}}{\overset{k_f = 2 \times 10^4\ mol^{-1}\ dm^3\ s^{-1}}{\rightleftharpoons}} AB_3(g)$

පියවර 2 $AB_3(g) + AB(g) \rightarrow 2AB_2(g)$ $k_2 = 0.5\ mol^{-1}\ dm^3\ s^{-1}$

පියවර 3 $2AB_2(g) + C_2(g) \rightarrow 2AB_2C(g)$ $k_3 = 4 \times 10^5\ mol^{-2}\ dm^6\ s^{-1}$

(i) මෙහි වේග නිර්ණායක පියවර කුමක්ද?

(ii) මෙම බහු පියවර ප්‍රතික්‍රියාවේ අතරමැදි සංයෝගය / සංයෝග මොනවාද?

(iii) ප්‍රතික්‍රියාවේදී සංක්‍රමණ අවස්ථා කීයක් පසු කරයිද?

(iv) ප්‍රතික්‍රියාව සඳහා සීඝ්‍රතා ප්‍රකාශනයක් ව්‍යුත්පන්න කරන්න.

(v) මෙම ප්‍රතික්‍රියාව සඳහා ශක්ති පැතිකඩක් ඇඳ ප්‍රතික්‍රියාවේ සක්‍රියන ශක්තිය Ea ලෙස නම් කරන්න.

(ලකුණු 5.0)

(6). (a) (i) සාන්ද්‍රණය 0.1 mol $dm^{-3}$ ක් වන ඒක භාෂ්මික දුබල අම්ල ද්‍රාවණයක (HA) pH අගය ගණනය කරන්න.

දුබල අම්ලයේ විඝටන නියතය $Ka = 1 \times 10^{-5}$ mol $dm^{-3}$

(ii) ඉහත අම්ල ද්‍රාවණයේ 25.00 $cm^3$ ක් සමග සම්පූර්ණයෙන් ප්‍රතික්‍රියා කිරීමට අවශ්‍ය සාන්ද්‍රණය 0.25 mol $dm^{-3}$ ක් වන NaOH ද්‍රාවණයක පරිමාව ගණනය කරන්න.

(iii) ඉහත (ii) අවස්ථාවේදී ද්‍රාවණයේ pH ගණනය කරන්න.

(iv) ඉහත අම්ල ද්‍රාවණයෙන් 25.00 $cm^3$ ක් ඉහත NaOH ද්‍රාවණය සමග අනුමාපනයේදී අන්තලක්ෂය නිර්ණය කිරීම සඳහා පහත දැක්වෙන දර්ශක අතුරින් කුමන දර්ශකය වඩාත් සුදුසු දැයි හේතු සහිතව සඳහන් කරන්න.

| දර්ශකය | pKIn |
|---|---|
| A | 3.5 |
| B | 7.0 |
| C | 8.8 |
| D | 9.5 |

(v) ඉහත (i) හි අම්ල ද්‍රාවණයෙන් 25.00 $cm^3$ කට ඉහත NaOH ද්‍රාවණයෙන් 15.00 $cm^3$ ක් එක් කළවිට ලැබෙන ද්‍රාවණයේ pH අගය ගණනය කරන්න.

(ලකුණු 5.0)

(b) (i) $Ag_2CO_3$ යනු ජලයේ මඳ වශයෙන් ද්‍රාව්‍ය සංයෝගයකි. $Ag_2CO_3$ හි සංතෘප්ත ජලීය ද්‍රාවණයක් තුළ ද්‍රාවිත $Ag_2CO_3$ හා $Ag_2CO_3(s)$ අතර පවතින සමතුලිතතාවය සඳහා තුලිත සමීකරණය ලියන්න.
මෙම සමීකරණය භාවිතා කරමින් $Ag_2CO_3(s)$ හි ද්‍රාව්‍යතා ගුණිතය (Ksp) සඳහා වන ප්‍රකාශනයක් ව්‍යුත්පන්න කරන්න.

(ii) 30 °C දී $Ag_2CO_3(s)$ හි $Ksp = 4 \times 10^{-12}$ $mol^3\ dm^{-9}$ වේ. 30 °C දී $Ag_2CO_3(s)$ හි ජල ද්‍රාව්‍යතාවය ගණනය කරන්න.

(iii) 30 °C දී සාන්ද්‍රණය 0.02 mol $dm^{-3}$ ක් වන ජලීය $AgNO_3$ ද්‍රාවණයක 500.0 $cm^3$ ක් තුළ ද්‍රාවණය කළ හැකි උපරිම $Ag_2CO_3$ ස්කන්ධය ගණනය කරන්න. (Ag - 108 , C - 12 , O - 16)

(ලකුණු 4.0)



Scanned with CamScanner

(c) 400 °C උෂ්ණත්වයකදී $CO(g)$ හා $H_2O(g)$ 0.05 mol බැගින් ද $CO_2(g)$හා $H_2(g)$ 0.1 mol බැගින් පරිමාව 2 $dm^3$ වන දෘඪ සංවෘත බඳුනකට එක් කරන ලදී.

400 °C දී පහත ගතික සමතුලිතය සඳහා Kc = 9 කි.

$$CO(g) + H_2O(g) \rightleftharpoons CO_2(g) + H_2(g)$$

(i) ඉහත ආරම්භක පද්ධතිය සඳහා Qc සොයන්න.

(ii) ඉහත Qc ඇසුරින් පද්ධතිය ගතික සමතුලිතතාවය පවතිද නැතිනම් ගතික සමතුලිතතාවට එළඹීමට කවර දිශාවකට ප්‍රතික්‍රියාව යොමු විය යුතු දැයි පහදන්න.

(iii) 400 °C දී ගතික සමතුලිතතාවට එලඹී පසු පද්ධතියේ එක් එක් සංරචකයේ සාන්ද්‍රණ සොයන්න.

(iv) 400 °C දී ගතික සමතුලිත පද්ධතියට පරිමාව 2 $dm^3$ වන වෙනත් සම්බන්ධ කළවිට එම පද්ධතියේ සංයුතිය කෙසේ වෙනස් වේදැයි පහදන්න.

(ලකුණු 6.0)

(7). (a) $Fe(s) + 2Fe^{3+}(aq) \rightarrow 3Fe^{2+}(aq)$ යනු 25 °C උෂ්ණත්වයේදී ස්වයංසිද්ධ වන ප්‍රතික්‍රියාවකි. සම්මත අවස්ථාවේ ඇති $Fe^{2+}$ අයන වලින් සමන්විත ලෝහ/ලෝහ අයන ඉලෙක්ට්‍රෝඩයක්ද, සම්මත අවස්ථාවේ ඇති $Fe^{2+}(aq)$ හා $Fe^{3+}(aq)$ අයන වලින් සමන්විත redox ඉලෙක්ට්‍රෝඩයක්ද, ලවණ සේතුවක්, සන්නායක කම්බි, ඇමීටරයක් සහ වෝල්ට්මීටරයක් ඔබට සපයා ඇත.

(i) ඉහත දී ඇති දෑ අතුරින් අවශ්‍ය ද්‍රව්‍ය පමණක් උපයෝගී කරගෙන සාදා ගත හැකි ගැල්වානි කෝෂයක නම් කරන ලද රූප සටහනක් ඇඳ + හා - අග්‍ර ද ලකුණු කරන්න.

(ii) ඉහත කෝෂයේ ඇනෝඩ හා කැතෝඩ ප්‍රතික්‍රියා ලියන්න.

(iii) කෝෂයේ සම්මුති අංකනය ලියන්න.

(iv) මෙම කෝෂයේ විද්‍යුත් ගාමක බලය 1.21 V ද $E^\circ_{Fe(s)/Fe^{2+}(aq)} = -0.44V$ ද නම් redox ඉලෙක්ට්‍රෝඩයේ ඔක්සිහරණ විභවය ගණනය කරන්න.

(v) ඉහත ගැල්වානි කෝෂයේ ලෝහ - ලෝහ අයන ඉලෙක්ට්‍රෝඩයේ පමණක් පරිමාව දෙගුණ වන තෙක් ජලය යොදා විද්‍යුත් විච්ඡේද්‍යය තනුක කලේ නම් කෝෂයේ විද්‍යුත් ගාමක බලය අඩුවේ ද, වැඩිවේ ද වෙනස් නොවේ ද යන වග සඳහන් කොට පැහැදිලි කරන්න.

(ලකුණු 5.0)

(b) (i) පහත දත්ත භාවිතා කර MgO(s) හි සම්මත දැලිස විසටන එන්තැල්පි සොයන්න.

| | |
|---|---|
| MgO(s) හි සම්මත උත්පාදන එන්තැල්පිය | = -635 kJ $mol^{-1}$ |
| Mg(s) හි සම්මත ඌර්ධවපාතන එන්තැල්පිය | = 148 kJ $mol^{-1}$ |
| Mg හි පළමු අයනීකරණ ශක්ති එන්තැල්පිය | = 736 kJ $mol^{-1}$ |
| Mg හි දෙවන අයනීකරණ ශක්ති එන්තැල්පිය | = 1448 kJ $mol^{-1}$ |
| ඔක්සිජන්හි සම්මත පරමාණුකරණ එන්තැල්පිය | = 249 kJ $mol^{-1}$ |
| ඔක්සිජන් හි සම්මත පළමු ඉලෙක්ට්‍රෝන ලබාගැනීමේ එන්තැල්පිය | = -141 kJ $mol^{-1}$ |
| ඔක්සිජන් හි සම්මත දෙවන ඉලෙක්ට්‍රෝන ලබාගැනීමේ එන්තැල්පිය | = +791 kJ $mol^{-1}$ |

(ii) FeO(s) හි සම්මත දැලිස විසටන එන්තැල්පි අගය 4195 kJ $mol^{-1}$ කි. MgO(s) සහ FeO(s) සම්මත දැලිස විසටන එන්තැල්පි සඳහා ලබාගත් අගයන් වල සාපේක්ෂ වෙනස සඳහා හේතුවක් යෝජනා කරන්න.

(iii) FeO(s) + Mg(s) → Fe(s) + MgO(s) යන ප්‍රතික්‍රියාව සඳහා එන්තැල්පි විපර්යාසය සොයන්න. මෙම ප්‍රතික්‍රියාව කාර්මිකව Fe නිෂ්පාදනය සඳහා සුදුසු ක්‍රමයක්ද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 6.0)

(c) A යනු $K_xFe_y(C_2O_4)_z.6H_2O$ යන සූත්‍රය ඇති ස්ඵටිකමය සන සංයෝගයකි. මෙය ප්‍රමාණාත්මකව විශ්ලේෂණය කිරීමේදී ලබා ගත් දත්ත පහත දැක්වේ.

I. සංයෝගයේ දන්නා ස්කන්ධයක් සාන්ද්‍රණය 1 mol $md^{-3}$ ක් වන $H_2SO_4$ තුළ සම්පූර්ණයෙන්ම දියකරන ලදී. මෙම ද්‍රාවණය 60 °C ක පමණ උෂ්ණත්වයකට රත්කර සාන්ද්‍රණය 0.01 mol $dm^{-3}$ ක් වන $KMnO_4$ ද්‍රාවණයක් සමග අනුමාපනය කරන ලදී. වැය වූ $KMnO_4$ පරිමාව 30.00 $cm^3$ ක් විය. (මෙහිදී Fe වලින් අනුමාපනයට බලපෑමක් නැත.)

II. අනුමාපන ප්ලාස්කුවේ ඇති ද්‍රාවණයට Zn කුඩු එකතු කර එය ඔක්සිහරණය කර නැවත ඉහත $KMnO_4$ ද්‍රාවණය මගින්ම අනුමාපනය කළ විට අන්තලක්ෂයේදී වැය වූ පරිමාව 5.00 $cm^3$ ක් විය.



Scanned with CamScanner

(i) පළමු අනුමාපනය සහ දෙවන අනුමාපනයේදී සිදුවන ප්‍රතික්‍රියා සඳහා තුලිත සමීකරණ ලියන්න.

(ii) පළමු ද්‍රාවණය 60 °C ක පමණ උෂ්ණත්වයකට රත් කරන්නේ ඇයි?

(iii) y සහ z අතර අනුපාතය සොයන්න.

(iv) A හි අණුක සූත්‍රය සොයන්න.

(ලකුණු 4.0

## C කොටස - රචනා

- ප්‍රශ්න දෙකකට **පමණක්** පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නයට ලකුණු **15** බැගින් ලැබේ.)

(8). (a) පහත සඳහන් සංයෝගයේ ව්‍යුහය සැලකිල්ලට ගනිමින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(මෙහි a, b, c, d, e, f බන්ධන වන අතර 1, 2, 3, 4, 5 කාබන් පරමාණු වේ.)

(i) a, b, c, d, හා e බන්ධන දිග ආරෝහණ අනුපිළිවෙලට ලියන්න.

(ii) වැඩිම ආම්ලිකතාවක් සහිත H සම්බන්ධ කාබන් පරමාණුව නම් කරන්න.

(iii) a,b, c, e බන්ධනයන්ගේ π බන්ධනයේ බන්ධන ශක්තිය ආරෝහණ පිළිවෙලට සකසන්න.

(iv) 1, 2, 3 ලෙස ලේබල් කර ඇති කාබන් පරමාණු අතර බන්ධන කෝණය සඳහන් කරන්න.

(v) f බන්ධනය සෑදීමට සහභාගී වන කාක්ෂික සඳහන් කරන්න.

(ලකුණු 3.0)

(b) (i) ඔබට සපයා ඇති කාබනික සංයෝග හා ප්‍රතිකාරක පමණක් භාවිතා කොට දී ඇති 'A' සංයෝගය පියවර 9 කට නොවැඩි පියවර සංඛ්‍යාවකින් සංස්ලේෂණය කරන්න.




(A)

<u>ප්‍රතිකාරක හා කාබනික සංයෝග</u>

$CH_3Br$, HCHO, $C_6H_5$-C≡CH, සාන්ද්‍ර $H_2SO_4$, $H_2O$, Mg, වියළි ඊතර්, තනුක NaOH, PCC, Pd, $H_2$

(ii)




යන පරිවර්තනය සිදු කරන්න.

(ලකුණු 10.0)

(c) පහත සඳහන් යුගලයන් එකිනෙක වෙන් කර හඳුනාගැනීමට රසායනික ක්‍රමයක් බැගින් යෝජනා කරන්න.

(i) $CH_3CH=CH_2$ , $CH_3CH=CHCH_3$

(ii) $CH_3CH_2Cl$ ,




(ලකුණු 2.0)



Scanned with CamScanner

9). (a) X යනු වර්ණවත් ජලීය ද්‍රාවණයක් වන අතර එහි කැටායන 3 ක් අඩංගු වේ. ඒවා හඳුනා ගැනීමට පහත ක්‍රියා අනුපිළිවෙල භාවිතා කරන ලදී.

| | පරීක්ෂාව | නිරීක්ෂණය |
|---|---|---|
| (1) | X ද්‍රාවණයට තනුක NaOH එක් කරන ලදී. | අවක්ෂේපයක් ලැබුණි. (A) |
| (2) | A අවක්ෂේපයට වැඩිපුර NaOH එක් කරන ලදී. | අවක්ෂේපයෙන් කොටසක් දියවී අවර්ණ ද්‍රාවණ (B) සහිත කොළ පැහැති අවක්ෂේපයක් ඉතිරි විය. (C) |
| (3) | (B) අවර්ණ පෙරණයට තනුක $H_2SO_4$ බින්දු වශයෙන් එක් කරන ලදී. | (D) සුදු අවක්ෂේපයක් ලැබුණි. |

C හා D අවක්ෂේප සඳහා පහත පරීක්ෂණ සිදුකරන ලදී.

| | පරීක්ෂණය | නිරීක්ෂණය |
|---|---|---|
| (4) | (C) කොළ පැහැති අවක්ෂේපයට වැඩිපුර $NH_3$ එකතු කරන ලදී. | අවක්ෂේපයෙන් කොටසක් දිය වී තද නිල් ද්‍රාවණයක් (E) ලබාදුනි. |
| (5) | ඉතිරි කොළ අවක්ෂේපය වාතයට නිරාවරණය කරන ලදී. | අවක්ෂේපය දුඹුරු පැහැවිය. (F) |
| (6) | D අවක්ෂේපයට සාන්ද්‍ර ඇමෝනියා එකතු කරන ලදී. | අවර්ණ ද්‍රාවණයක් ලැබුණි. (G) |

(i) X ද්‍රාවණයේ අඩංගු කැටායන හඳුනාගන්න.
(ii) A අවක්ෂේපයේ අඩංගු රසායනික විශේෂවලට අදාළ අණුක සූත්‍ර ලියන්න.
(iii) B, E, G ද්‍රාවණවල අඩංගු රසායනික සංයෝගවල අණුක සූත්‍ර ලියන්න.
(iv) F අවක්ෂේපය හඳුනාගන්න. F සෑදීමට අදාළ තුලිත රසායනික සමීකරණය ලියන්න.
(v) 3 හා 6 පරීක්ෂණවලට අදාළ තුලිත රසායනික සමීකරණ ලියන්න.

(ලකුණු 7.5)

(b) $C_2O_4^{2-}$, $NO_3^-$ , හා $SO_4^{2-}$ අයන අඩංගු ද්‍රාවණයක 100 $cm^3$ කට වැඩිපුර $BaCl_2$ ද්‍රාවණයක් එකතු කරන ලදී. ලැබුණු අවක්ෂේපය පෙරා වියලා එහි ස්කන්ධය මැන ගන්නා ලදී. එය 0.7 g විය. මෙම අවක්ෂේපය තනුක HCl ද්‍රාවණයක දිය කොට ලැබෙන පෙරණය ආම්ලික $KMnO_4$ ද්‍රාවණයක් සමඟ ප්‍රතික්‍රියා කරවන ලදී. ඒ සඳහා සාන්ද්‍රණය 0.02 $mol dm^{-3}$ වූ $KMnO_4$ ද්‍රාවණයෙන් 20.00 $cm^3$ ක පරිමාවක් අවශ්‍ය විය.
අනතුරුව ඉහත $BaCl_2$ එක්කළ පසු ලැබෙන පෙරණයට Al කුඩු හා වැඩිපුර NaOH එකතු කර ප්‍රතික්‍රියා කරවන ලදී. මෙහිදී පිට වූ වායුව සාන්ද්‍රණය 0.1 $mol dm^{-3}$ ක් වූ HCl ද්‍රාවණ 30.00 $cm^3$ ක් තුළට යවන ලදී. ඉතිරි වූ HCl උදාසීන කිරීමට අවශ්‍ය වූ සාන්ද්‍රණය 0.1 $mol dm^{-3}$ ක් වූ NaOH පරිමාව 10.00 $cm^3$ ක් විය.(Ba - 137 , S - 32 , O - 16 , C - 12)

(i) අවක්ෂේපයේ අඩංගු සංයෝග නම් කරන්න.
(ii) තනුක HCl අම්ලය එකතු කිරීමෙන් පසු ලැබුණු පෙරණය ආම්ලික $KMnO_4$ සමඟ සිදු කරන ප්‍රතික්‍රියාව සඳහා තුලිත සමීකරණය ලියන්න.
(iii) ද්‍රාවණයේ $C_2O_4^{2-}$ අයන සාන්ද්‍රණය ගණනය කරන්න.
(iv) ද්‍රාවණයේ $SO_4^{2-}$ අයන සාන්ද්‍රණය ගණනය කරන්න.
(v) ක්ෂාරීය මාධ්‍යයේදී $NO_3^-$ අයන හා Al අතර ප්‍රතික්‍රියාව සඳහා තුලිත සමීකරණය ලියන්න.
(vi) ඉහත (v) හිදී පිට වූ වායුව හඳුනාගැනීම සඳහා පරීක්ෂණයක් ලියන්න.
(vii) ද්‍රාවණයේ $NO_3^-$ අයන සාන්ද්‍රණය ගණනය කරන්න.

(ලකුණු 7.5)

Scanned with CamScanner

(10). (a) පහත සටහන් I, II, III හා IV හි සංයෝග හඳුනාගෙන ඊට අදාළ ප්‍රභේද හඳුනාගන්න.

I.




(i) A හඳුනාගන්න.

(ii) $a_1$ - $a_7$ ප්‍රභේද හඳුනාගන්න.

II.




(i) B හඳුනාගන්න.

(ii) $b_1$, $b_2$, $b_3$ ප්‍රභේද හඳුනාගන්න.

III.




(i) C හඳුනාගන්න.

(ii) $c_1$, $c_2$ ප්‍රභේද හඳුනාගන්න.



Scanned with CamScanner

IV.




(i) D හඳුනාගන්න.

(ii) $d_1$, $d_2$, $d_3$ ප්‍රභේද හඳුනාගන්න.

(ලකුණු 7.0)

(b) (i) බෙන්සීන් හි දැකිය හැකි ප්‍රතික්‍රියා වර්ගය සඳහන් කරන්න.

(ii) බෙන්සීන් නිර්ජලීය $AlCl_3$ හමුවේ 2-chloro-2-methylpropane සමග දක්වන ප්‍රතික්‍රියාවේ යාන්ත්‍රණය ලියන්න.

(iii) පහත සඳහන් පරිවර්තනයන් කරන්න.

I. 


II. $H{-}C{\equiv}C{-}H \rightarrow HOOCCH_2CH_2COOH$

III. $CH_3CH_2CH_2Br \longrightarrow CH_3{-}\overset{O}{\overset{\|}{C}}{-}CH_3$

IV. $CH_3{-}\overset{O}{\overset{\|}{C}}{-}CH_3 \longrightarrow CH_3{-}C{\equiv}C{-}Ag$

V. 


VI. 


VII. 


(c) $CH_3CH_2CH_3$, $CH_3CHO$, $CH_3CH_2OH$, $HCOOH$ යන සංයෝගයන්හි සාපේක්ෂ අණුක ස්කන්ධ ආසන්නව සමාන වුවත් ඒවායේ තාපාංක එකිනෙක වෙනස් වේ. මෙම සංයෝගයන්හි තාපාංක ආරෝහණ වන අනුපිළිවෙලට සකසා ඒ සඳහා හේතු දක්වන්න.

(ලකුණු 8.0)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources